ශීර්ෂය 118- කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය - 2024

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 118 - කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2025 මැයි 30 දින ප්‍රධාන ගණන්දිමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 ජුනි 24 දින ප්‍රධාන ගණන්දිමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1 හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදිම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වු ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වු ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය ප්‍රකාශන චක්‍රලේඛ විධිවිධානවලට අනුකූල නොවීම

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්ගේ 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 හි 7.6 වගන්තිය ප්‍රකාරව මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ (ඒසීඒ-එෆ්) සංශෝධිත අයවැය ප්‍රතිපාදන තීරුවෙහි වාර්ෂික අයවැය ප්‍රතිපාදනවලට මූ.රෙ 66 හා 69 මාරු කිරීම් හා පරිපූරක ප්‍රතිපාදන ගැලපීමෙන් පසු අගය යොදාගත යුතු වුවද, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ සංශෝධිත අයවැය ප්‍රතිපාදන ලෙස මූ.රෙ 66 හා 69 මාරු කිරීම් හා පරිපූරක ප්‍රතිපාදන ගැලපීමක් සිදු නොකොට වාර්ෂික අයවැය ප්‍රතිපාදනයන්හි අගයන් දක්වා තිබුණි.	ඉදිරියේදී රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අනුව කටයුතු කරනු ලැබේ.	රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශය ප්‍රකාරව වාර්ෂික අයවැය ප්‍රතිපාදනවලට මූ.රෙ මාරු කිරීම් හා පරිපූරක ප්‍රතිපාදන ගැලපීමෙන් පසු අගය යොදාගත යුතුය.

1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

1.6.2.1 ආදායම් ලැබීම්

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී ඒසීඒ- 1(i) ආකෘතිය මඟින් ඉදිරිපත්කර ඇති හිඟ ආදායම් පිළිබඳව ප්‍රකාශයේ 2022 වර්ෂයේ නිවැරදි ශුද්ධ ආදයම් වටිනාකම වන රු.219,195,182 ක් රු.437,085,714 ක් ලෙස සටහන් වීමෙන් සිදුව තිබූ වරද 2024 වර්ෂයේදීද නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.	පිළිගනිමි. ඒසීස් -1(i) මඟින් ඉදිරිපත් කර ඇති හිඟ ආදායම් පිළිබඳ ප්‍රකාශයේ 2022 වර්ෂයේ නිවැරදි ශුද්ධ ආදායම් වටිනාකම වන රු.219,195,182 අතපසුවීමකින් රු.437,085,714 ක් ලෙස දැක්වීමෙන් සිදු වූ වරද නිවැරදි කිරීම සම්බන්ධව ඉදිරියේදී කටයුතු කරනු ලැබේ.	ආදායම් ප්‍රකාශනයට නිවැරදි වටිනාකම් ඇතුළත් කළ යුතුය.

1.6.2.2 මූලධන වියදම්

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	අමාත්‍යාංශයට හිමිකාරීත්වය පවතින අමාත්‍යාංශය විසින් භාවිතයට ගනු ලබන එකතුව රු.59,820,513 ක් වටිනා වාහන 09 ක් හා වටිනාකම සඳහන් නොකළ වාහන 08 ක් අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය නොවන වත්කම්වලට ඇතුළත් කර නොතිබුණි.	කෘෂිකර්ම අමාත්‍යාංශයේ CIGAS පද්ධතිය වෙත රථය ඇතුළත් කර ගැනීමට කටයුතු කරනු ලැබේ.	අයිතිය නිරවුල් වත්කම්වල වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කළ යුතුය.

(ආ)	භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්වරයාගේ 2017 දෙසැම්බර් 21 දිනැති අංක 2/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය අනුව වෙනත් අමාත්‍යාංශ වෙත වාහන පැවරීමේදී පැවරුම්ලාභී අමාත්‍යාංශය නමින් ලියාපදිංචි කර ගැනීමට අවස්ථාව ලබා දිය යුතු වුවත් එසේ නොකර කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් භාවිතා කරන රු.59,450,000 ක් වටිනාකම වූ වාහන 15 ක් සහ වටිනාකම සඳහන් නොකළ වාහන 07ක් මෙම අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි.	මෙම වාහන පිළිබඳ හේතු සොයාබලා අවශ්‍ය පියවර ඉදිරියේදි ගනු ලැබේ.	අයිතිය නිරවුල් වත්කම්වල වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත කළ යුතුය.
(ඇ)	ලියාපදිංචි අයිතිය නොමැතිව පරිහරණය කරන වාහන, ලියාපදිංචි අයිතිය ඇති ආයතනයේ එකඟතාවය මත,තම ආයතනයේ නමින් ලියාපදිංචි කරගැනීමට හෝ ලියාපදිංචි අයිතිය ඇති ආයතනය වෙත විධිමත්ව පවරාදීමට කටයුතු කළ යුතු නමුත් 2017 දෙසැම්බර් 21 දිනැති අංක 2/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව පවරා ගැනීමට හෝ නැවත භාරදීමට කටයුතු නොකළ වෙනත් ආයතනයන්හි නීත්‍යානුකූල හිමිකාරීත්වයට යටත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ භාවිතයේ ඇති වටිනාකම රු.276,450,000 ක් වූ වාහන 29 ක් CIGAS පරිගණක පද්ධතියේ සහ ජංගම නොවන වත්කම් ලෙස මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත්කර ඇති බව නිරීක්ෂණය විය.	වාහන 18 ක් වැවිලි අංශයට අයත් වාහන වේ. ඉතිරි වාහන 11 පසුගාමී ග්‍රාමීය ප්‍රදේශ සංවර්ධන සහ ගෘහාශ්‍රිත සත්ත්ව පාලන හා සුළු ආර්ථික භෝග ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි කර තිබූ අතර,මේ වනවිට කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ එම රථ ලියාපදිංචි සිදු කිරිමට නියමිතය.	ලියාපදිංචි අයිතිය ඇති වත්කම්වල වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවල සහ පරිගණක පද්ධතිය තුළ ගිණුම්ගත කළ යුතුය.
(ඈ)	අමාත්‍යාංශයේ භාවිතයේ පවතින වාහන 80 ක 2024 දෙසැම්බර් 31 දිනට තක්සේරු වටිනාකම ලෙස විගණනයට ඉදිරිපත් කර තිබුණු වටිනාකම හා CIGAS පරිගණක පද්ධතියේ ඇතුළත් වාහන වටිනාකම්වල රු.23,459,410 ක වෙනසක් නිරීක්ෂණය විය.	කෘෂිකර්ම අංශයට අයත් වාහන 06 සම්බන්ධයෙන් තක්සේරු කිරීමට කටයුතු කරමින් පවතින අතර එම වාර්තා ලද වහාම CIGAS පරිගණක පද්ධතියට ඇතුළත් කරනු ලැබේ. පශු සම්පත් අංශයට අයත් වාහන සම්බන්ධයෙන් වාහනවල වටිනාකම් ලෙස දක්වා ඇත්තේ ඇතැම් වාහන වල මිලදී ගත් වටිනාකම් හෝ එම අවස්ථාවේදී ඇතැම් වාහනවල රක්ෂිත වටිනාකම් වේ. 2024 දෙසැම්බර් 31 දිනට අදාළ වාහන තක්සේරු වටිනාකම් ලෙස ඉදිරිපත් කර ඇත්තේ වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 04/2018හි විධිවිධාන ප්‍රකාරව කොම්ප්ට්‍රෝලර් ජෙනරාල් වෙත රජයේ මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීම පිණිස සහ වත්කම් කළමනාකරණ	වාහන වල නිවැරදි වටිනාකම් පරිගණක පද්ධතියට ඇතුළත් කළ යුතුය.

		චක්‍රලේඛ අංක 06/2023හි විධිවිධාන ප්‍රකාරව රජයේ මූල්‍ය නොවන වත්කම් කළමනාකරණය පද්ධතියට (NFMS) ඇතුළත් කිරීම සඳහා තක්සේරු කරන ලද වටිනාකම් වේ.ඒ අනුව 2024 දෙසැම්බර් 31 දිනට තක්සේරු වටිනාකම් ලෙස විගණනයට ඉදිරිපත් කර තිබුණු වටිනාකම් හා CIGAS පරිගණක පද්ධතියේ ඇතුළත් වාහනවල වටිනාකම් වල වෙනස්කම් පවතින බවට එකඟ වෙමි.	
(ඉ)	එවකට කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යවරයා වෙත වෙන්කර දී ඇති පොහොර අංශයට අයත් රු.18,000,000 ක් වටිනා අංක KW-8202 දරන වාහනය 2021 මාර්තු 21 දින අනතුර සඳහා රු.7,500,000 ක රක්ෂණ වන්දියක් ගෙවීමට රක්ෂිත ආයතනය එකඟ වී ඒ අනුව වාහනය අලුත්වැඩියාවට 2022 දෙසැම්බර් 12 දින අදාල ගරාජයට භාර දී තිබුණි. 2023 මාර්තු 23 දින රු.5,625,000 ක මුදලක් වාහන අලුත්වැඩියා ආයතනයට රක්ෂණ සංස්ථාව විසින් ගෙවීම්කර තිබුණි. 2023 දෙසැම්බර් 21 දින හා 2024 සැප්තැම්බර් 27 දින විගණනය විසින් භෞතිකව නිරීක්ෂණය කරන විට හා මෙම වාර්තාවේ දින වන විට වර්ෂ 02 ක් ඉක්මගොස් ඇතත් අදාළ අලුත්වැඩියාව සිදුකර නොතිබුණි.	අංක KW-8202 දරන රථය බත්තරමුල්ල ගරාජයකට අලුත්වැඩියාවට 2022.12.12 දින යොමු කර ඇතත් මෙම වාර්තාවේ දින වන විටත් එම අළුත්වැඩියාව නිමකර භාරදී නොතිබුණි.2024.04.04 දින එහි ප්‍රගතිය විමසීමේදී එම ආයතනය විසින් 2024.04.06 දින සිට දින 90 ක් ඇතුළත අලුත්වැඩියාව සිදු කොට භාර දීමට කටයුතු කරන බව දන්වා ඒ අනුව 2024.07.30 දින රථයේ අලුත්වැඩියා කටයුතු නිම කොට 2024.08.15 දිනට ලබා දෙන මෙන් අමාත්‍යාංශය එම ගරාජයට දන්වන ලදි.එහෙත් 2024.08.15 දින රථය භාර නොදුන් බැවින් 2024.09.06 දින ජේ.ස.ලේ පාලන 1 හා සහකාර ලේකම් (ප්‍රවාහන) විසින් ගරාජයට ගොස් රථය භෞතිකව පරීක්ෂා කිරීමේදී එම ගරාජය විසින් 2024.10.23 දිනැති ලිපිය මගින් අදාළ අමතර කොටස් දේශීය වෙළඳපොළේ නොමැති වීම හේතුවෙන් මව් සමාගමෙන් ආනයනය කර අලුත්වැඩියා කොට නැවත භාර දීමට මාස 03 ක කාලයක් ඉල්ලීම් කර ඇත. එම වාහනයේ අලුත්වැඩියා කටයුතු පිළිබඳ පරීක්ෂා කොට වාර්තාවක් ලබා දීමට කටයුතු කරන ලෙස යාන්ත්‍රික ඉංජිනේරු වෙත 2025.01.01 දින ලිඛිතව දන්වන ලදි. නැවතත් මෙම අලුත්වැඩියාව පිළිබඳව 2025.03.11 දින අතිරේක ලේකම්, (ප්‍රවාහන හා විමර්ශන) ප්‍රධානත්වයෙන් සහ සහකාර ලේකම් (ප්‍රවාහන) හා යාන්ත්‍රික ඉංජිනේරු හා අදාල ගරාජයේ කළමණාකරුගේ සහභාගීත්වයෙන් පවත්වන ලද සාකච්ඡාව පරිදි එම මෝටර්ස් හි Workshop Manager විසින් 2025.03.11 දින සිට මාස 02 කින් අලුත්වැඩියා කටයුතු සම්පූර්ණ කර දීමට එකඟ විය.එනමුත් 2025.04.12. දින ලිපිය මගින් අලුත්වැඩියා කටයුතු සඳහා තවත් මාස දෙකක කාලයක් අවශ්‍ය බව එම මෝටර්ස් විසින් දන්වන	අලුත්වැඩියා සිදු කර වාහනය භාවිතයට ගත යුතුය.

		ලදි.මෙම වාහනයේ අලුත්වැඩියා කටයුතු පිළිබඳ පරීක්ෂා කොට වාර්තාවක් ලබා දීමට කටයුතු කරන ලෙස යාන්ත්‍රික ඉංජිනේරු වෙත 2025.05.19 දින ලිඛිතව දන්වා ඇත.	
(ඊ)	එවකට පසුගාමී ග්‍රාමීය ප්‍රදේශ සංවර්ධන සහ ගෘහාශ්‍රිත සත්ත්ව පාලන හා සුළු ආර්ථික භෝග වගා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යවරයාට වෙන්කර දී තිබුණු හා මේ වන විට ග්‍රාමීය ආර්ථික අංශයට අයත් වටිනාකම රු.43,000,000 ක රේන්ජ් රෝවර් රථය 2021 ජුනි 21 දින එංජිම අධික ලෙස රත්වී වාහනය පන ගැන්විය නොහැකි තත්වයට පත්වීම හේතුවෙන් අළුත් වැඩියාව සඳහා යොමුකර තිබුණි. නමුත් මෙම දෝෂය සම්බන්ධයෙන් මෝටර්රථ තාක්ෂණය සම්බන්ධ ස්වාධීන රාජ්‍ය අයතනයක් වෙතින් වාර්තාවක් ලබා නොගෙන රථයේ නියෝජිත ආයතනයෙන්ම වාර්තාවක් ලබාගෙන තිබුණි. මු.රෙ.104 යටතේ පරීක්ෂණයක් පැවැතිවීමට වසර 02 ක් ඉක්මයාමෙන් පසුව කමිටුවක් පත් කර තිබූ අතර මු.රෙ.104 (3) ප්‍රකාරව පූර්ණ වාර්තාවක් හෝ ප්‍රාරම්භක වාර්තාවක් මේ දක්වා ඉදිරිපත් කර නොතිබුණි. තවද 2021.06.23 දින අළුත්වැඩියාවට ඉදිරිපත් කල රු.3,076,877 ක මුල් ඇස්තමේන්තුවට ඉටුකරගැනිමට හැකියාව තිබූ අලුත්වැඩියාව වර්ෂ 02 මාස 05කට පසුව එම ආයතනය විසින්ම ලබාගත් රු.9,041,001 ක මුල් ඇස්තමේන්තුවකට අලුත්වැඩියාවට යොමුකර තිබුණි. අලුත්වැඩියාව නිමකර නොතිබියදී 2023.12.30 දින රු.9,041,001 ක චෙක්පතක් ලියා මුදල් පොතේ අදාළ සටහන් තැබීම සිදුකර පසුව එම චෙක්පතේ වටිනාකම රාජ්‍ය ආදායමට බැරකර තිබුණු අතර ඊට ප්‍රථමද එම කාර්ය වෙනුවෙන්ම නැවත 2024.07.15 දිනැතිව වවුචරයක් ගෙවීම සඳහා පිළියෙල කර තිබුණි. 2024.07.22 දින වන විට මෙම මෝටර් රථයේ අලුත්වැඩියා කටයුතු නිමකර තිබුණද අදාළ ගෙවීම් සිදුකර වාහනය භාර ගැනීමට හා එහි ධාවන පරීක්ෂාවන් සිදුකිරීමට විගණිත දිනයවන විටත් කටයුතුකර නොතිබුණි.	වාහනයේ දෝෂය සිදුවන අවස්ථාවේ අමාත්‍යංශයේ වාහන අලුත්වැඩියා සම්බන්ධයෙන් කටයුතු කළ තැපැල් දෙපාර්තමේන්තුවේ වරලත් යාන්ත්‍රික ඉංජිනේරුවරයා ගේ උපදෙස් පරිදි මෙම දෝෂයට අදාළව දේශීය නියෝජිත වෙත ප්‍රශ්නාවලියක් ඉදිරිපත් කර පිළිතුරු ලැබීමෙන් පසු තවදුරටත් විස්තරාත්මක පැහැදිලි කිරීම් දේශීය නියෝජිත වෙතින් ලබා ගෙන ඇත. යම් රථයක බාහිර අනතුරක් (accident) හේතුවෙන් සිදුවන හානියක දී රථයට රක්ෂණ ආවරණ හිමිකම ලැබේ. තාක්ෂණික හේතූන් මත රථයේ එන්ජිමේ සිදුවන අභ්‍යන්තර හානි රක්ෂණයෙන් ආවරණය නොවේ. දෝෂය සම්බන්ධ දේශීය නියෝජිත සමාගම කරුණු දැක්වීම හා වාහනයේ රියදුරු හා වාහනයේ ගමන් ගත් ඇමැති ආරක්ෂක අංශයේ නිලධාරියාගේ ප්‍රකාශ සැළකිල්ලට ගෙන ඒ සම්බන්ධයෙන් ලබා දුන් වාර්තාවේ, දෝෂය සඳහා වගකිව යුතු පුද්ගලයෙක් හෝ පාර්ශවයන් සම්බන්ධයෙන් අවසන් නිගමනයකට පැමිණ නොමැත. එහෙත් ඒ සම්බන්ධව පත් කළ මු.රෙ.104(4) යාන්ත්‍රික ඉංජිනේරුවෙකුගෙන් සමන්විත වු අවසන් පරීක්ෂණ කමිටුව දේශීය නියෝජිත ආයතනය වෙත ගොස් තාක්ෂණ නිලධාරින් හමුවී වැඩි දුර කරුණු පරීක්ෂා කිරීම මගින් මෙම එන්ජිමට සිදු වූ හානියට රථයේ රියදුරු වැරදි කරු ලෙස නිගමනය කර නිර්දේශ ඉදිරිපත් කර ඇත. වාහනය අලුත්වැඩියාව සඳහා අනතුර සිදුවූ 2021 වසරේ සිට වරින් වර ඇස්තමේන්තු 05ක් පමණ ලබාගෙන ඇති නමුත් වැය ශීර්ෂවල ප්‍රමාණවත් ප්‍රතිපාදන නොතිබීම මත අලුත්වැඩියාව සිදු කිරීමට නොහැකි වී ඇත. 2023 වර්ෂයේ අවසාන කාර්තුවේ දී භාණ්ඩාගාරය වෙතින් ප්‍රතිපාදන ලැබීමෙන් අනතුරුව අලුත්වැඩියාවට අදාල යාවත්කාලීන කරන ලද ඇස්තමේන්තුවක් ලබා ගෙන ඉදිරි කටයුතු සිදුකරන ලදි. අලුත්වැඩියාව 2024 වර්ෂයේ ජූලි මස නිමකිරීමෙන් අනතුරුව අමාත්‍යංශයේ යාන්ත්‍රික ඉංජිනේරු විසින් ධාවන පරීක්ෂාවක්	වාහනයේ දෝෂයට අදාළ නිශ්චිත හේතු හා ඊට වගකිවයුතු පාර්ශවයන් හඳුනා ගැනීමටත් කඩිනමින් අලුත්වැඩියාවන් සිදු කර ධාවනය සඳහා යොදාගැනීමට අවශ්‍ය පියවර ගතයුතුය.

සිදු කර 2024.07.19 දිනැතිව ලබා දුන් අළුත්වැඩියාවට අදාල නිර්දේශ මත ග්‍රාමීය ආර්ථික අංශයේ පාලන අංශය විසින් (ප්‍රවාහන ඒකකය) අනුමත වවුවරය ගිණුම් අංශය වෙත ඉදිරිපත් කර ඇත.

කාර්යය නිමවීමෙන් සාධාරණ කාලයක් තුළ ගෙවීම් සිදු කිරීමට අමාත්‍යාංශය අපොහොසත් වී ඇත.

රාජ්‍ය වියදම් කළමනාකරණය මැයෙන් වූ සීඒ/1/17/1 හා 2010.05.14 දිනැති ජනාධිපති කාර්යාල චක්‍රලේඛයේ ප්‍රතිපාදන අනුව අමාත්‍යවරයා ධූර කාලය දරණ තෙක් හෝ අමාත්‍යවරයා ඔහුගේ රියදුරෙක් ලෙස යම් අයෙක්ගේ සේවය ලබා ගැනීමට කැමැත්ත පළ කිරීම අවසන් වීම යන දෙකෙන් පළමුව එළඹෙන දිනය දක්වා තාවකාලික පදනම මත ගරු අමාත්‍යවරයාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයේ නිලධරයන් පත් කරනු ලැබේ.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු මෙම වාර්තාවේ 4.10,4.8(ඈ) සහ 1.6.2.2(ඊ) ඡේදයන්ට අදාළ නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 අග්‍රිම කළමනාකරණය

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
පෙර පැවති රජයේ පොහොර සමාගම් වන සී/ස ලංකා පොහොර සමාගම හා සී/ස කොළඹ කොමර්ෂල් පොහොර සමාගම විසින් 2018,2019,2020 හා 2021 වර්ෂයන්හිදී ආනයනය කරන ලද පොහොර සඳහා වූ ණයවර ලිපි කල්පිරෙන අවස්ථාවේදී අදාළ සැපයුම්කරුවන්ට ගෙවීම් කිරීමට අවශ්‍ය මුදල් එම අවස්ථාවේදී භාණ්ඩාගාරයෙන් නොලැබීම මත කෙටිකාලීන ණය මගින් පියවීම් කළ එකතු වටිනාකම	ණයවර ලිපි කල් පිරීමේදී වන වියදම අදාළ බැංකු වෙත පියවීම පොහොර සමාගම සතු වගකීමකි. සැපයුම්කරුවන්ගේ බිල්පත් පියවීමට රාජ්‍ය පොහොර සමාගම් වී සඳහා පොහොර සහනාධාර මිලකට ලබා දීමේදී ගොවීන්ගෙන් අයකර ගන්නා මුදල ප්‍රමාණවත් නොවූ බැවින් පොහොර මිල තීරණය කිරීමේ කමිටුවේ තීරණ මත පදනම්ව පොහොර වල වෙළඳපල වටිනාකම ගණනය කර වී සඳහා පොහොර සහනාධාර මිලකට ලබාදීමේදී ගොවීන්ගෙන් අයකර ගන්නා මුදල අඩු කර ඉතිරි මුදල අමාත්‍යාංශයේ ඉල්ලීම් මත සමාගම් වෙත ණයවර ලිපි කල්පිරෙන දිනට ගෙවීම මහා භාණ්ඩාගාරය විසින් සිදු කරන ලදී.	පොහොර ආනයනයේදි දැරිය යුතු මුදල් පියවීම හා ණයට ගැනීම් පිළිබද විධිමත් අධීක්ෂණයක් අමාත්‍යාංශය විසින් සිදුකල යුතුය.

රු.43,742,559,911 ක් අදියර 05 ක් යටතේ වන සේ එකතු වටිනාකම රු.47,465,632,771 ක කාලීන ණය බවට බැංකුව විසින් පරිවර්තනය කර එම ණය මුදල් පියවීමට අදාළව 2024 වර්ෂයේදී අමාත්‍යාංශය විසින් රු.3,401,114,581 ක පොලී වියදමක් දරා තිබුණි.	ඒ අනුව, සමාගම ලබා දෙන ලද තොරතුරු අනුව අමාත්‍යාංශය විසින් පොහොර ණයවර ලිපි කල්පිරෙන දිනට සැපයුම්කරුට ගෙවීමට නියමිත මුදල ලබා දීමට භාණ්ඩාගාරයෙන් මුදල් නොලැබුණු බැවින් රාජ්‍ය පොහොර සමාගම විසින් මහජන බැංකුවෙන් ලබා ගන්නා ලද කෙටි කාලීන ණය මුදලක් මඟින් කල්පිරුණු සැපයුම්කරුවන්ගේ බිල්පත් නියමිත දිනට පියවීමට කටයුතු කර ඇත. 2019 අයවැය මඟින් සලසා දී තිබුණු ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම හේතුවෙන් එකී බිල්පත් පියවීමට ඉදිරිපත් කරන ලද ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා 20/0293/204/022 හා 2020.02.05 දිනැතිව ලබා දුන් අමාත්‍ය මණ්ඩල අනුමැතියට අනුව කල්පිරුණු ණයවර ලිපි සඳහා මහජන බැංකුව වෙත ගෙවිය යුතු කෙටි කාලීන ණය මුදල් වල එකතුව සහ එම කෙටි කාලීන ණය මුදල් දිගු කාලීන ණය මුදලක් බවට පරිවර්තනය කිරීමේදී ගත වූ කාලයට අදාළ වූ පොළිය අදියර 05 ක් යටතේ කාලීන ණය මුදලක් බවට පත් කිරීමට කටයුතු කර ඇත.ඉහත සඳහන් කාරණා කෘෂිකර්ම අමාත්‍යාංශයේ පාලනයෙන් පරිබාහිර වේ.	

3.2 ආදායම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ආදායම් සංකේත අංක 2003.07.00 යටතේ වන රජයේ වී මිලදී ගැනීමේ වැඩසටහනට අදාළව 2024 වර්ෂයේ ආදායම් ඇස්තමේන්තුව රු.390,000,000 ක් වුවද ඒසීඒ-1 ආකෘතියට අනුව වර්ෂයයේ ආදායම් රැස් කිරීම රු.86,430,015 ක් විය. ඒ අනුව මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම තුළින් අපේක්ෂිත ආදායම රැස්කර ගැනීමේ ප්‍රගතිය සියයට 22 ක අවම මට්ටමක පැවති බව නිරීක්ෂණය විය.	2024 වර්ෂය සඳහා අමාත්‍යාංශ ආදායම් ඇස්තමේන්තුව රු.මි.100 ක් වශයෙන් වුවද, එය භාණ්ඩාගාරය විසින් රු.මි.390 ලෙස සංශෝධනය කර තිබුණි. අයහපත් කාලගුණික තත්වය මත නිශ්පාදන පහත වැටීම මත හා 2022/23 මහ කන්නය සඳහා අඩු ආදායම්ලාභී පවුල් වලට නොමිලේ වී බෙදා දීමෙන් පසු ඉතිරි වූ තොග විකුණුම මත එම ආදායම් පමණක් 2003.07.00 දරණ ආදායම් ශීර්ෂයට බැර වී ඇත. තවදුරටත් හිඟ ආදායම් අයවිය යුතු සියලු දිස්ත්‍රික් ලේකම් කාර්යාල දැනුවත් කර එම කටයුතු පසු විපරම් කරමින් පවතී.	හිඟ ආදායම අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	2024 වර්ෂය තුළ රැස්කරගෙන තිබූ රු.86,430,015 ක වටිනාකමින් රු.13,738,768 ක් 2021 වර්ෂ අවසාන වන විට පැවති හිඟ ආදායම වන රු.376,678,134 ක ශේෂයේ	වී මිලදී ගැනීමේ වැඩ සටහන 2018/19 මහ කන්නය, 2020/21 මහ කන්නය, 2021 යල කන්නයට අදාලව හිඟ ශේෂයන් අය කර ගැනීම සඳහා ආදායම් ශීර්ෂය වන 2003.07.00 බැර කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් මෙන්ම අමාත්‍යාංශයේ අදාළ අංශ දැනුවත් කර ඇත.	හිඟ ආදායම අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

	ඇතුළත්ව තිබූ 2018/2019 මහ කන්නය,2020/2021 මහ කන්නය සහ 2021 යල කන්නයට අදාළ හිඟ ශේෂයන් වෙනුවෙන් ලැබී තිබුණි. ඒ අනුව වී මිල දී ගැනීමේ වැඩසටහනට අදාළව පවතින හිඟ ආදායම රැස් කර ගැනීමේ ප්‍රගතිය සියයට 3.5 ක ඉතා පහළ මට්ටමක පවතින අතර මු.රෙ.127(1)(ආ), මු.රෙ.127(6),මු.රෙ.128(1)(ඌ) සහ මු.රෙ.128 (2) කෙරෙහි අවධානය යොමු කළයුතු බවට නිරීක්ෂණය විය.		
(ඇ)	ගිණුම් අංශයේ තොරතුරු අනුව 2024 වර්ෂය තුළ රජයේ වී මිලදී ගැනීමේ වැඩසටහනට අදාළව ලැබී තිබූ රු.86,430,015 ක වටිනාකම තුළ ඇතුළත් රු.73,330,179 ක් 2022/2023 මහ කන්නයට අදාළව දිස්ත්‍රික්ක 04 කින් එනම් අම්පාර, ත්‍රිකුණාමලය, අනුරාධපුර සහ පොළොන්නරුව යන දිස්ත්‍රික්ක වලින් ලැබී ඇති බවට කරුණු අණාවරණය වුවද, 2023 වර්ෂයේ ඒසීඒ- 1(i) - හිඟ ආදායම් පිළිබඳ ප්‍රකාශනයට අනුව 2022 වර්ෂයෙන් පසුව හිඟ අදායම් ශේෂයක් නිරූපණය නොවන බැවින් විගණනයට එම වටිනාකම පිළිබඳ තහවුරුවක් නොවීය.	2022/23 මහ කන්නයට අදාළව අස්වැන්න නෙළීම 2023 වර්ෂයේ අප්‍රේල් මස වන විට සිදු කරනු ලැබූ අතර ඒ අනුව 2022 වර්ෂයෙන් පසු එම වාර්තා කරනු ලැබූ 2023 වර්ෂයේ හිඟ ආදායම් ශේෂයක් නිරූපණය නොවේ. මෙම අයවූ හිඟ අදායම් පෙර කන්නයන්ට අදාළ වේ.	හිඟ ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම් ගත කළ යුතුය.
(ඈ)	අමාත්‍යාංශයේ කෘෂිකර්ම අංශය විසින් මු.රෙ.128(2)(ඇ),මු.රෙ.176(1) හා 2015 ජූලි 20 දිනැති අංක 01/2015 රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛයේ 08 ඡේදය පරිදි අංක 2003-07-00 දරන ආදයම් සංකේතය යටතේ 2024 වර්ෂයට අදාළව අර්ධ වාර්ෂික හිඟ ආදායම් වාර්තාවන්හි පිටපත් කිසිවක් එම කාලසීමාව අවසන් වී මාසයක් ඇතුළත විගණනය වෙත ඉදිරිපත්කර නොතිබුණි.	2024 වර්ෂය සඳහා 2003.07.00 රජයේ වී මිලදී ගැනීමේ වැඩසටහනට අදාල වාර්ෂික හිඟ ආදායම් වාර්තා සකස් කර රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කර ඇත.මෙම වර්ෂයේ සිට මු.රෙ 176 (1) ප්‍රකාරව විගණකාධිපති වෙත යොමු කිරීමට සටහන් කර ගතිමි.	හිඟ ආදායම් වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

3.3 වියදම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	වැය ශීර්ෂ 240 මගින් අවස්ථා 05 කදී වෙන්කල පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදනයන් සියයට 11 ක සිට සියයට 44 ක පරාසයක් දක්වා ඉතිරි වී තිබුණි.	ප්‍රතිපාදනයන් ඉතිරිවීම් සිදු වී මට බලපෑ හේතු ලෙස අමාත්‍ය කාර්ය මණ්ඩලයක් නොසිටීම,ගෙවීමට බිල්පත්‍ර ඉදිරිපත් නොවීම,අපේක්ෂිත ලෙස වී මිළදී නොගැනීම,නෛතිකමය හේතු මත ගෙවීම නැවැත්වීම හා දිස්ත්‍රික් කාර්යාල සඳහා වෙන්කල ප්‍රතිපාදන ඉතිරිවීම් මෙයට හේතු වී තිබුණි.	නිවැරදි ඇස්තමේන්තු සකස් කර ප්‍රතිපාදන වෙන් කර ගත යුතුය.
(ආ)	අමාත්‍යාංශය විසින් මු.රෙ.66 මඟින් මූලික වාර්ෂික ඇස්තමේන්තු ප්‍රතිපාදන වෙනත් වැය විෂයයන්ට මාරු කිරීම් අවස්ථා 11 කදී සිදුකර ඇතත්, එසේ මාරු කිරීමෙන් පසුවද අදාළ වැය විෂයයන්ගේ ප්‍රතිපාදන සියයට 11 සිට සියයට 98 ක පරාසයක් දක්වා ප්‍රතිපාදන ඉතිරිවී තිබුණි.	අමාත්‍යාංශය විසින් මු.රෙ.66 මගින් මූලික වාර්ෂික ඇස්තමේන්තු ප්‍රතිපාදන වෙනත් වැය විෂයයන්ට මාරු කිරීම් සිදුකර ඇතත් වියදම් කළමනාකරණය කර ගැනීම,Zoom තාක්ෂණය ඔස්සේ රැස්වීම් පැවැත්වීමෙන් ගමන් වියදම් ඉතිරිවීම,පොළී අනුපාත ඉහලයාම හේතුවෙන් ණය මුදල් ඉල්ලුම් නොකිරීම සහා බිල්පත් ඉදිරිපත් නොවීම මෙම ඉතිරිවීම් වලට හේතුවිය.	වැය විෂයයන් සඳහා ප්‍රතිපාදන මාරුකිරීමේ දී විචක්ෂණශීලීව කටයුතු කළ යුතුය.
(ඇ)	අමාත්‍යාංශය විසින් මු.රෙ.66 මඟින් අවස්ථා 12 කදී වෙනත් වැය විෂයයන්ගෙන් මාරු කර ගත් ප්‍රතිපාදනවලින් සියයට 3 සිට සියයට 44 දක්වා ප්‍රතිපාදන ඉතිරිවී තිබුණි.	අමාත්‍ය කාර්ය මණ්ඩලයක් නොසිටීම,ඉන්ධන මිළ ගණන් පහළ යාම සහ කිතුල් සංවර්ධන මණ්ඩලයට වෙන්කල ප්‍රතිපාදනය ප්‍රමාණවත් නොවීම මත මාරුකරගැනීම හේතුවෙන් ඉතිරි වීම් සිදුවී ඇත.	වැය විෂයයන් සඳහා ප්‍රතිපාදන මාරුකිරීමේ දී විචක්ෂණශීලීව කටයුතු කළ යුතුය.
(ඈ)	මු.රෙ.50 (ii) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරියා විසින් වාර්ෂික අයවැය ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණයෙන් නිවැරදිව පිළියෙළ කලයුතු අතර මු.රෙ.50(iii) වගන්තිය ප්‍රකාරව සකසුරුවම්කම හා කාර්යක්ෂමතාව පිළිබඳ නිසි සැළකිල්ලෙන් යුක්තව ඇස්තමේන්තු සම්පාදනය කළයුතු වුවද අමතරව පරිපූරක ඇස්තමේන්තු මගින් හා මු.රෙ.66 මඟින් ප්‍රතිපාදනයන් වෙනස් කර ගෙන තිබුණු අවස්ථා පහත දැක්වේ.		

(i)	කෘෂිකර්ම අංශයේ වැය විෂයයන් 05 ක් සඳහා පරිපූරක ඇස්තමේන්තු මගින් රු.683,986,275 ක් සහ වැය විෂයයන් 02 ක් සඳහා මු.රෙ.66 මාරු කිරීම් මගින් රු.19,056,609 ක ප්‍රතිපාදන මාරුකරගෙන ඇති බව නිරීක්ෂණය විය.	අමාත්‍යාංශය ප්‍රතිපාදන මාරුකර ගැනීමට හා ඉතිරිවීමට බලපෑ කරුණු ලෙස මහ කන්නයේ වී මිළදී ගැනීම අපේක්ෂා කල පරිදි සිදු නොවීම,කෘෂිකර්ම නවීකරණ ව්‍යාපෘතියේ කාර්ය මණ්ඩල වැටුප් ගෙවීම සඳහා මාරු කරගැනීම හා තක්සේරු දෙපාර්තමේන්තු බිල්පත්‍ර පරික්ෂා කර නොතිබීම හේතුවෙන් ගෙවීම් නොකිරීම.	වෙනත් වැය විෂයයන් සඳහා ප්‍රතිපාදන මාරුකිරීමේ දී විචක්ෂණශීලීව කටයුතු කළ යුතුය.
(ii)	වැවිලි කර්මාන්ත අංශය විසින් වැය විෂයයන් දෙකක් සඳහා සලසා තිබුණු මුළු ප්‍රතිපාදනය වූ රු.180,000,000 කට අමතරව රු.77,865,000 ක අතිරේක ප්‍රතිපාදනයක් ලබාගෙන තිබුණි.එය ප්‍රතිශතයක් ලෙස සියයට 43 ක් විය.	118-1-28-0-1003 වැය විෂය - 2024.01.10 දින 03/2024 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව වැඩි වූ ජීවන වියදම් දීමනාව හා 2024.06.27 දින රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2015 (v) රාජ්‍ය සේවයේ විධායක සේවා නිලධාරීන්ට විශේෂ දීමනාව ගෙවීමට පරිපූරක ඇස්තමේන්තු මඟින් ප්‍රතිපාදන ලබා ගෙන ඇති බව එම අමාත්‍යාංශය විසින් වාර්තා කර ඇත. 118-1-28-0-01403 වැය විෂය - විදුලි බිලෙහි මිල උච්චාවචනය නිසා ප්‍රතිපාදන ඌන වීම නිසා මු.රෙ.66 යටතේ ප්‍රතිපාදන මාරු කර ගෙන ඇති බව එම අමාත්‍යාංශය විසින් වාර්තා කර ඇත.	අතිරේක ප්‍රතිපාදන ලබාගැනීමේ දී විචක්ෂණශීලීව කටයුතු කළ යුතුය.
(iii)	වැවිලි කර්මාන්ත අංශයේ වාර්ෂික අයවැය ඇස්තමේන්තු මඟින් ප්‍රතිපාදන සලසාගෙන නොතිබුණු වැය විෂයයන් 3 ක් සඳහා පරිපූරක ඇස්තමේන්තු මඟින් රු.40,391,799 ක ප්‍රතිපාදන වෙන් කරගෙන තිබූ අතර එහි ඇතුළත් එක් වැය විෂයක් සඳහා මු.රෙ.66 මාරු කිරීම් යටතේද රු.11,868,200 ක ප්‍රතිපාදන මාරු කරගෙන තිබුණි.	විදේශ ප්‍රදාන වලට වාර්ෂික ඇස්තමේන්තු මඟින් මුදල් වෙන් නොකරන අතර පරිපූරක ඇස්තමේන්තු මඟින් අවස්ථා තුනකදී ප්‍රතිපාදන ලබා ගෙන ඇත.කෘෂිකර්ම අංශ නවීකරණ ව්‍යාපෘතියේ 118-2-29-009-2509 (17) වැය විෂය සඳහා රජයේ නිලධාරීන්ගේ වැටුප් ගෙවීමට විදේශ මූල්‍යකරණ ආශ්‍රිත පිරිවැය යටතේ 2024 අයවැය මඟින් ප්‍රතිපාදන වෙන් වී නොමැති වූ බැවින් මු.රෙ.66 යටතේ ප්‍රතිපාදන මාරු කර ගන්නා ලදි.	වෙනත් වැය විෂයයන් සඳහා ප්‍රතිපාදන මාරුකිරීමේ දී විචක්ෂණශීලීව කටයුතු කළ යුතුය.
(ඊ)	සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වැය විෂයයන් 03 ක් සඳහා සලසා තිබුණු එකතුව රු.2,100,000 ක ශුද්ධ ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම ඉතිරි වී තිබුණු අතර තවත් පුනරාවර්තන වැය විෂයයන් 10 ක් සඳහා සලසා තිබුණු එකතුව රු.107,400,000 ක ශුද්ධ ප්‍රතිපාදන වලින් රු.58,017,085 ක් හෙවත් සියයට 48 සිට සියයට 88 දක්වා ප්‍රමාණයක් ඉතිරි වී තිබුණි.	අයවැය චක්‍රලේඛ 01/2024 අනුව රාජ්‍ය වියදම් කළමනාකරණය කිරීම හා ගොඩනැගිලි ඉදිකිරීම්, යන්ත්‍ර මිල දී ගැනීම සීමා කිරීම හේතුවෙන් ප්‍රාග්ධන වැය විෂයන්හි ප්‍රතිපාදන ඉතිරි විය.	ප්‍රතිපාදන උපයෝජනයේ දී විචක්ෂණශීලීව කටයුතු කළ යුතුය.

(ඍ)	සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන වැය විෂයයන් 02 ක් සඳහා සලසා තිබුණු එකතුව රු.2,500,000 ක ශුද්ධ ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම ඉතිරි වී තිබුණු අතර තවත් ප්‍රාග්ධන වැය විෂයයන් 04 ක් සඳහා සලසා තිබුණු එකතුව රු.13,500,000 ක ශුද්ධ ප්‍රතිපාදන වලින් රු.10,172,258 ක් හෙවත් සියයට 40 සිට සියයට 89 දක්වා ප්‍රමාණයක් ඉතිරි වී තිබුණි.	අයවැය චක්‍රලේඛ 01/2024 අනුව රාජ්‍ය වියදම් කළමනාකරණය කිරීම හා ගොඩනැගිලි ඉදිකිරීම්, යන්ත්‍ර මිල දී ගැනීම් සීමා කිරීම හේතුවෙන් ප්‍රාග්ධන වැය විෂයන්හි ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.	ප්‍රතිපාදන උපයෝජනයේ දී විචක්ෂණශීලීව කටයුතු කළ යුතුය.
(ඎ)	රසායනික පොහොර ආනයන තහනම බලාත්මක වූ 2021 අප්‍රේල් 27 දිනට පොහොර සමාගම් සතුව ඉතිරිව තිබූ සහනාධාර පොහොර තොග එම තහනම ඉවත්කරන ලද 2021 නොවැම්බර් 30 දක්වා අලෙවිකර තිබූ ආකාරය හා ඒවා අලෙවිකළ මිල ගණන් සම්බන්ධයෙන්, සහනාධාර මුදල් ඉල්ලුම්කර තිබූ පෞද්ගලික පොහොර සමාගම් 08 ක් පදනම්කර ගනිමින් සිදුකළ විගණන පරීක්ෂාවේදී අනාවරණය වූ කරුණු අනුව, සහනාධාර පොහොර ක්‍රමයේ ප්‍රධානතම අරමුණ වනුයේ ගොවීන්ට රු.1,500ක සහන මිලක් යටතේ 50kg පොහොර මිටියක් ලබාගැනීමට අවකාශය සැලසීම වුවත්, එසේ ආනයනය කරන ඍජු පොහොර යොදා ගනිමින් සකසනු ලබන විවිධ මිශ්‍ර පොහොර වර්ග විගණනයට ලක්වූ උක්ත සමාගම් විසින් ඉතා අධික මිල ගණන් යටතේ වෙළඳපොළ තුළ අලෙවිකර තිබුණි. එසේ අධික මිල ගණන් යටතේ මිශ්‍ර පොහොර අලෙවි කිරීමට හේතුව වනුයේ ඒ සඳහා භාවිතා කරන ලද ඇතැම් අමුද්‍රව්‍යන්හි මිල අධික වීම ලෙස කරුණු අනාවරණය වුවද, එවැනි මිල අධික මිශ්‍ර පොහොර වර්ගයන් සැකසීම සඳහා සහනාධාර ක්‍රමය යටතේ	එක් එක් බෝග සඳහා නිර්දේශිත ප්‍රමිතිගත අනුපාත වලට අනුව සකස් කරන ලද මිශ්‍රණ පොහොර වෙළඳපොළට නිකුත් කිරීමේදී ඒ සඳහා පොහොර සමාගම් විසින් මෙහෙයුම් පිරිවැයක් දරණ බැවින් මිශ්‍ර කරන ලද කිලෝග්‍රෑම් 50 ක පොහොර මිටියක් වැඩි මිලකට වෙළඳපොලට නිකුත් කිරීම සඳහා සමාගම් වලට අවස්ථාව ලබා දී තිබුණි. නමුත් රසායනික පොහොර ආනයනික තහනම ක්‍රියාත්මක වු 2021 අප්‍රේල් 27 දින සිට එම තහනම ඉවත් කරන ලද 2021 නොවැම්බර් 30 දින දක්වා කාල පරාසය තුළ රු.1,500 ක උපරිම මිල අභිබවා සමාගම් කිහිපයක් විසින් වැඩිමිලට පොහොර අලෙවිකර ඇති බව විගණන විමසුම මගින් පෙන්වා දී ඇත.තවද රු.1,500ක සහනාධාර මිල යටතේ සමාගම් විසින් උපයාගත යුතුව තිබූ ආදායම සහ පොහොර වැඩි මිලට අලෙවි කිරීම මගින් සමාගම් විසින් සත්‍ය වශයෙන් උපයාගෙන ඇති මුළු ආදායම අතර වෙනස අඩුකර රජය විසින් ගෙවිය යුතු සහනාධාර මුදල ගණනය කර ගෙවීම් සඳහා යොමු කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි. රසායනික පොහොර ආනයන තහනම ඉවත් කල 2021.11.30 දිනට සමාගම් සතුව ඉතිරි වී පැවති රසායනික පොහොර තොග වරලත් විගණන ආයතන මගින් සත්‍යාපනයක් සිදු කර එම තොග සහනාධාර ක්‍රමවේදයෙන් ඉවත් කර ඇති අතර 2021.11.30 දිනෙන් පසුව රට තුල පැවති ආර්ථික අර්බුදය සහ පොහොර ආනයනයේ දී මතු වූ දුෂ්කරතා හේතුවෙන් පොහොර මිල ගණන් සීඝ්‍ර ලෙස ඉහල යාමක් සිදු විය. මිශ්‍ර පොහොර සකස් කිරීම සඳහා තවත් ඍජු පොහොර වර්ග (විශේෂයෙන් MOP වැනි පොහොර වර්ග) නැවත ආනයනය කරන ලදී.එහිදී ඩොලරයේ ඉහළ යාම, ආනයනික සමාගම්වලට ණයවර ලිපි (LC) විවෘත කිරීමේදී දැඩි සීමා ඇති වීමත් සමඟ පොහොර ආනයනය ඉතා සීමා විය. මේ නිසා ඉතිරි වී තිබූ	රු.1,500ක සහනාධාර මිල යටතේ සමාගම් විසින් උපයාගත යුතුව තිබූ ආදායම සහ පොහොර වැඩි මිලට අලෙවි කිරීම මගින් සමාගම් විසින් සත්‍ය වශයෙන් උපයාගෙන ඇති මුළු ආදායම අතර වෙනස අඩුකර රජය විසින් ගෙවිය යුතු සහනාධාර මුදල ගණනය කර ගෙවීම් කළ යුතුය.

	ආනයනය කරන ලද සෘජු පොහොර වර්ගයන් යොදා ගැනීම හා එම පොහොර සහනාධාර මිල ඉක්මවූ මිලකට අලෙවි කිරීම සම්බන්ධයෙන් ජාතික පොහොර ලේකම් කාර්යාලය විසින් ගනු ලැබූ කිසිදු ක්‍රියාමාර්ගයක් විගණනයට නිරීක්ෂණය නොවීය.	පොහොර සමඟ ඉහල මිල ගණන් යටතේ අලුතින් ආනයනය කරන ලද පොහොර යොදා ගනිමින් මිශ්‍රණ පොහොර සකස් කිරීම සහ ඇසුරුම් කිරීම (bag cost) වැනි අනෙකුත් පිරිවැය ඉහල යාමත් එම කාලයේදී රට තුල ඉන්ධන මිල විශාල ලෙස ඉහල යාමත් වැනි කරුණු නිසා වෙළඳපලේ අලෙවි වූ මිශ්‍රණ පොහොරවල මිල ගණන් විශාල ලෙස ඉහල යාමක් වාර්තා විය.	
(එ)	සහනාධාර මිලට පොහොර සැපයීම මත සමාගම්වලට සිදුවන පාඩුව ගණනය කිරීමේදී අදාළ ආනයනික පොහොර වර්ගයේ භාවිතය හා එම පොහොර අලෙවිකර ඇති සත්‍ය මිල ගණන් තහවුරුකර ගැනීමකින් තොරව එම පොහොර තොගයේ මුළු ප්‍රමාණයම සහනාධාර මිලකට අලෙවි වූවා සේ සලකා වාණිජ මිල හා සහනාධාර මිල අතර වෙනස අදාළ පොහොර තොගයේ සම්පූර්ණ ප්‍රමාණය සඳහාම ගණනය කිරීම හා එම ගෙවීම් සහතික කිරීමට කටයුතු කිරීම මු.රෙ.138 ට පටහැනි බව හා එසේ ගණනයකර ගෙවීම් කිරීම අනාර්ථික වියදම් දැරීමක් ලෙස විගණනයට නිරීක්ෂණය විය.	පැවති සහනාධාර ප්‍රතිපත්තිය අනුව සහනාධාර ක්‍රමවේදය යටතේ ආනයනික පොහොර තොගයක් සඳහා ගෙවීම් කිරීමේදී පාදක කර ගනු ලබන්නේ අදාල පොහොර තොගයේ ආනයනය පිළිබඳ තොරතුරු වේ. (ආනයනික පොහොර ප්‍රමාණය, ආනයනික මිල, ආනයනික දිනය හා එම දිනයන්ට අදාල විනිමය අනුපාත) සහනාධාර ගෙවීම සඳහා ලිපිගොනු පිළියෙල කල යුත්තේ පොහොර තොගය ආනයනය වී මාස 6 කට පසුව වේ. එබැවින් 2018.04.06 දින සිට එනම් පොහොර සහනාධාර ක්‍රමවේදය ආරම්භයේ සිටම සමාගමක් විසින් ආනයනය කළ පොහොර තොගයක් සඳහා මාස 6 ක් කල් පිරීමට පෙර ගෙවීම් සිදු කර නොමැත.කෙසේ වෙතත් පොහොර තොගයකට අදාල ගෙවීම් සිදුකිරීමට පෙර එම පොහොර බෙදා හැර ඇති ආකාරය පිළිබඳ පොහොර බෙදා හැරීමේ වාර්තාව සහ අළෙවිය තහවුරු කිරීමේ ලිපි (Distribution Plan and sales confirmation letter) පොහොර තොගයට අදාළ සෑම ලිපි ගොනුවකම සමාගම් විසින් ඇතුලත් කල යුතුය. පැවති සහනාධාර ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වූ ක්‍රමවේදයට අනුව වෙළෙඳපල තුල සහනාධාර මිල ගණන් යටතේ පොහොර අළෙවි වූ අතර පොහොර භාවිතය සිදුවූ ආකාරය පිළිබඳව පසු විපරමක් කිරීම සඳහා සහනාධාර ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.	සහනාධාර මිලට පොහොර සැපයීම මත උපයාගත යුතුව තිබූ ආදායම හා සමාගම් විසින් සත්‍ය වශයෙන් උපයාගෙන ඇති මුළු ආදායම අතර වෙනස අඩුකර රජය විසින් ගෙවිය යුතු සහනාධාර මුදල ගණනය කර ගෙවීම් කළ යුතුය.
(ඒ)	2021 අගෝස්තු 18 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය ප්‍රකාරව ආනයනය කර 2021 සැප්තැම්බර් 23 මෙරටට රැගෙනවිත් රසායනාගාර වාර්තා අසමත් වීම හේතුවෙන් නැවත හරවා යවන ලද කාබනික පොහොර මෙට්‍රික් ටොන් 96,000 වෙනුවෙන් අත්තිකාරම් සුරක්ෂණයක් **(Advance Guarantee)** ලබා ගැනීමකින්	'චීන කාබනික පොහොර සැපයුම් සමාගම හා රජයේ පොහොර සමාගම් දෙක අතර ඇතිකරගත් අධිකරණ සමථය ක්‍රියාත්මක කිරීමේදී පැන නැගී ඇති ගැටළු නිරාකරණය කර ගැනීම' මැයෙන් 2022 අගෝස්තු 12 දින අමාත්‍ය මණ්ඩල සංදේශය ඉදිරිපත්කර ඇති අතර මෙම ගැටළුව මිත්‍රශීලී එකඟතාවයකින් දෙරට අතර විසඳා ගැනීම සඳහා වන යෝජනා අමාත්‍ය මණ්ඩල වෙත ඉදිරිපත්කරන ලෙස විදේශ අමාත්‍යතුමාගෙන් ඉල්ලා සිටීමට උක්ත සංදේශය සඳහා 2022 සැප්තැම්බර් 13 දින අමාත්‍ය මණ්ඩල තීරණ ලබා දී ඇත. ඒ අනුව මෙම	සැපයුම්කරු වෙත ගෙවීම් කළ වටිනාකම අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

	තොරව රු.1,382,720,494 ක් අදාළ විදේශීය පොහොර සැපයුම්කරු වෙත ගෙවීම් කිරීමෙන් ශ්‍රී ලංකා රජයට සිදු වූ මූල්‍යමය පාඩුව සම්බන්ධයෙන් 2022 අගෝස්තු 26 දින විගණකාධිපති විසින් නිකුත්කරන ලද විශේෂ විගණන වාර්තාව මඟින් ඉදිරිපත් කර තිබූ විගණන නිර්දේශ කිසිවක් 2024 දෙසැම්බර් 31 දිනවන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි.	කාබනික පොහොර ආනයනය කිරීමේ ක්‍රියාවලිය මේවන තෙක් අවසන් වී නොමැත.

3.4 බැරකම් හා බැදීම්වලට එළඹීම

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති බැදීම් හා බැරකම්වල වටිනාකම හා මහා භාණ්ඩාගාරයේ වාර්තා අනුව එදිනට බැදීම් හා බැරකම්වල වටිනාකම් අතර පිළිවෙලින් රු.4,618,804 ක් හා රු.1,697,296 ක වෙනසක් නිරීක්ෂණය විය.	කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලද බැදීම් CIGAS හි උඩුගත කර තිබියදී එම දෙපාර්තමේන්තුව විසින්ද නැවතත් CIGAS හි එම බැදීම් උඩුගත කර ඇත.ඒ අනුව රු.4,618,804 කින් ද්විගණනය වී ඇත. දිස්ත්‍රික් ලේකම් කාර්යාල විසින් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලද බැරකම් CIGAS හි උඩුගත කර තිබියදී දිස්ත්‍රික් ලේකම් කාර්යාල විසින්ද නැවතත් CIGAS හි එම බැරකම් උඩුගත කර ඇත. ඒ අනුව රු.4,813 කින් ද්විගණනය වී ඇති අතර රු.1,692,482 ක බැරකම් වටිනාකම් අමාත්‍යාංශයේ ගිණුම් අංශයට වාර්තා නොකර CIGAS හි උඩුගත කර ඇත.	සියලු බැදීම් හා බැරකම් නිවැරදිව සොයා බලා මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කළ යුතුය.
(ආ)	2024 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ කෘෂිකර්ම අංශය විසින් රු.2,302,666 ක්ද, පශු සම්පත් අංශය රු.20,637 ක් සහ වැවිලි කර්මාන්ත අංශය රු.45,074 ක් වූ බැදීම් හා බැරකම් ඇතිකරගෙන තිබුණද අදාළ බැදීම් හා බැරකම් ලේඛනයේ ඇතුළත් කර නොතිබුණි.	සිගාස් වැඩසටහනෙහි බැදීම් බැරකම් ඇතුලත් කළ හැක්කේ පවතින ප්‍රතිපාදන ප්‍රමාණය මත පමණක් බැවින් රු.1,934,380 කට අදාළ ඉතිරි වටිනාකම වන රු.1,659,642 ක් මූල්‍ය ප්‍රකාශනයේ බැදීම් බැරකම් ප්‍රකාශනයේ ඇතුලත් කර ඇත. මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කරන අවස්ථාවේ ප්‍රවාහන අංශයෙන් ලද බැරකම් ලේඛනය අනුව බැරකම් වටිනාකම ලෙස රු.316,064 ක් බැරකම් ලේඛනයට ඇතුලත් කර ඇත. නමුත් ඊට අදාල වවුචරය ලැබී ඇත්තේ පෙබරවාරි මාසයේ වන අතර එහි වටිනාකම 291,412 ක් ලෙස වෙනස් වී ඇත. ඉතිරි රු.76,873 ක වටිනාකම ඉදිරියේදී බැදීම් හා බැරකම් නිවරදිව ගිණුම් ගත කිරීමට කටයුතු කරමි.	සියලු බැදීම් හා බැරකම් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර බැරකම් ලේඛනයට ඇතුළත් කළ යුතුය.

	පශු සම්පත් අංශයේ ගිණුම් අංශය විසින් බැරකම් ලේඛනය සකස් කරනු ලැබ ඇත්තේ 2025.01.22 දින වන අතර වවුචර්පත් ගිණුම් අංශය වෙත ලැබී ඇත්තේ ඊට පසු දිනයන්හිදීය. රු.41,025.00 වටිනාකමැති අංක 16/02/2025 වවුචර්පත පොදු තැන්පත් ගිණුමට අදාල ගෙවීමකි.2025.02.11 දින මීට අදාල ගෙවීම් සිදු කර ඇත.08/02/2025 වවුරයේ වටිනාකම් රු.17,160.00 කි. එය බැරකම් ලේඛනයේ ඇතුලත් කර ඇත. වැවිලි අංශයේ බැරකම් නිශ්චිත සටහන් නොවීම ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව වාර්තා කර ඇත.	

3.5 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියළුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවත්, වාර්තාවේ 4.10 ඡේදය ප්‍රකාරව විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී නොතිබුණි.	විගණන විමසුම් සඳහා පිළිතුරු ඉදිරියේදී ඉදිරිපත් කිරීමට කටයුතු කරමි.	නිශ්චිත කාලසීමාවන් තුළ සියළුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම කළයුතුය.

3.6 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

නිරීක්ෂණය			ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
නීති,රීති හා රෙගුලාසි වලට යොමුව	**වටිනාකම රු.**	**අනුකූල නොවීම**		
2024 දෙසැම්බර් 18 දිනැති වත්කම් කළමණාකරන චක්‍රලේඛ අංක 05/2024 සහ කොම්ප්ට්‍රෝලර් ජනරාල්ගේ 2024 මැයි 20 දිනැති අංක CGO/NFAMS/01/03 දරන ලිපිය		අපහරණය සඳහා හදුනාගෙන තිබූ වාහන 07 ක් අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.	KS – 6781, KO – 0024, KW–8202 හා CAV 5064 අංක දරන වාහන වත්කම් කළමනාකරණ චක්‍රලේඛ 05/2024 ප්‍රකාරව සුබෝපභෝගී වාහන අපහරණය යටතේ අපහරණයට නියමිත රථයන් වේ. KM – 5207 අංක දරණ රථය රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2020 ප්‍රකාරව වාර්ෂිකව සිදු කළ යුතු වාහන අපහරණ ක්‍රියාවලියට අනුව ටෙන්ඩර් කිරීම සඳහා ප්‍රසම්පාදන අංශය වෙත යොමු	අදාළ වාහන අපහරණය කිරීම කළ යුතුය.

		කර ඇත. CAB – 3288 හා PC – 4812 මේ වන විට වැව්ලි අංශය මෙම අමාත්‍යාංශයේ විෂය පථයට අයත් නොවේ.

3.7 බැංකු ගිණුම් මෙහෙයවීම

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	භාණ්ඩාගාර ලේකම්ගේ අංක BDKBP/01/01/03-2023 දරන 2022 දෙසැම්බර් 21 දිනැති අයවැය චක්‍රලේඛයේ 18 වැනි වගන්තිය ප්‍රකාරව අහෝසි වී ගිය වැය ශීර්ෂවලට අදාළ අක්‍රීය නිල බැංකු ගිණුම් සහ අනුමත අග්‍රිම ගිණුම් වසා දැමීමේ කාර්යයේ වගකීම අහෝසි වූ අමාත්‍යාංශවල සේවය කළ ප්‍රධාන මූල්‍ය නිලධාරි/ ප්‍රධාන ගණකාධිකාරි වෙත පවරා තිබුණි.2022 වර්ෂයේදී අහෝසි කරන ලද රාජ්‍යය අමාත්‍යාංශයට අයත් ලංකා බැංකුවේ ගිණුම් අංක 7040184 දරන රු.5,620,828 ක ශේෂයක් ඇතුළත් බැංකු ගිණුම විගණිත දින වන විටත් වසා දැමීමට කටයුතුකර නොතිබුණු අතර අහෝසි වී ගිය රාජ්‍ය අමාත්‍යාංශයෙහි ලේකම් නමින් තවදුරටත් පවත්වාගෙන යන බව නිරීක්ෂණය විය.	පෙර පැවති රාජ්‍ය අමාත්‍යාංශය දැනට කෘෂිකර්ම පශු සම්පත් ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ අංශ වශයෙන් පවත්නා බැවින්, ඒ අනුව බැංකු ගිණුම් නාම වෙනස් කිරීමට කටයුතු කරමින් පවතී.	අහෝසි වූ අමාත්‍යාංශයවල බැංකු ගිණුම් වසා දැමීම හෝ සුදුසු ක්‍රියාමාර්ගයක් ගත යුතුය.
(ආ)	ලේකම්, කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු හා පශු සම්පත් අමාත්‍යාංශය නමින් ලංකා බැංකුවේ පවතින අංක 7040507 දරන අක්‍රීය බැංකු ගිණුම සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර හෝ මෙම වාර්තාවේ දිනය වන විටත් එම බැංකු ගිණුම වසා දැමීමට කටයුතු කර නොතිබුණි.	අමාත්‍යාංශ වරින් වර වෙනස් වීම නිසා අක්‍රියව පවතින මෙම ගිණුම පරික්ෂා කර වසා දැමීමට කටයුතු කරමි.	අක්‍රීය බැංකු ගිණුම් නොපමාව වසාදැමීම කර ඒ පිලිබද මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කළ යුතුය.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	අමාත්‍යාංශයේ පශු සම්පත් අංශය මගින් අනුරාධපුර දිස්ත්‍රික්කයේ අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන් ඉගෙනුම ලබන තෝරාගත් පාසල් 20ක දරුවන්ගේ	මූලික සැලැස්ම සැකසීමේදී මසක් වයස සතෙකුගේ වටිනාකම රු.1000 ක් ලෙස සලකා සැලසුම් සකස් කර ඇතත් දෙසැම්බර් මස වන විට එම වටිනාකම රු.1200 දක්වා	ව්‍යාපෘතිය මෙහෙයවීම හා නඩත්තු කිරීම සම්බන්ධ

	පෝෂණය ඉහළ නැංවීමේ අරමුණින් එක් පාසලක දෙමාපියන් 10 දෙනෙකු සඳහා මසක් වයසැති කුකුළු පැටවුන් 10 බැගින් ලබා දීමේ ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 2 ක් වෙන්කර එමගින් නිම කිරීමට අපේක්ෂිත කුකුළු කොටු ගණන 200 ක් විය. සමාලෝචිත වර්ෂය අවසානයේ භෞතික ප්‍රගතිය සියයට 100 ක් ලෙස දක්වා ඇතත් ප්‍රතිලාභීන් 166 දෙනෙකු සඳහා පමණක් කුකුළු පැටවුන් ලබාදී ඇති අතර ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීමෙන් පසු ව්‍යාපෘතිය මෙහෙයවීම හා නඩත්තු කිරීම හා අවධානම් තත්ත්වයන්ට මුහුණදෙන ආකාරය සම්බන්ධ තොරතුරු ව්‍යාපෘති යෝජනාවට ඇතුළත්කර නොතිබුණි.	වැඩි වී තිබුණි. ඒ අනුව මිලියන 02 ක මුදලට ලබාදිය හැකි වූයේ එක් පවුලකට සතුන් 10 බැගින් පවුල් 166 කට පමණි.මෙම වැඩසටහන මෙහෙයවීම උතුරු මැද පළාත් කාර්යාලය මඟින් සිදුකරන ලද අතර නඩත්තු වියදම් ප්‍රතිලාභීන් විසින් දරාගත යුතුවේ.උතුරු මැද පළාතේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදයට අනුව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන අතර එහිදී සතුන් ලබාදී සතියක් ඇතුලත මියගියහොත් ඒ වෙනුවෙන් සතුන් නැවත ලබාදෙනු ලැබේ. තවද මසක් යනතුරු රැක බලාගත් සතුන් ලබාදෙන නිසා මිය යාමේ අවධානම ඉතා අඩු මට්ටමක පවතී.	තොරතුරු ව්‍යාපෘති යෝජනාව තුළ ඇතුළත් කළ යුතුය.
(ආ)	අමාත්‍යාංශයේ පශු සම්පත් අංශය මගින් අභිජනන ගොවිපලවල් ඉදිකිරීමේ ව්‍යාපෘතිය යටතේ තිරප්පනේ සත්ත්ව ගොවිපලෙහි එළු අභිජනන ඒකකය ස්ථාපන කිරීම, සහිවාල් අභිජනන ඒකකය ස්ථාපනය කිරීම හා උතුරු මැද පළාතේ කෘතිම සිංචන සේවය ශක්තිමත් කිරීම වෙනුවෙන් රු.මිලියන 23 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණි. තිරප්පනේ සත්ත්ව ගොවිපලෙහි එළු අභිජනන ඒකකය ස්ථාපන කිරීම සඳහා රු.මි.3 ක ප්‍රතිපාදන ලබාදී ඇතත් සමාලෝචිත වර්ෂය අවසාන වන තෙක් සතුන් මිලදී ගැනීම සිදුකර නොතිබුණි.සහිවාල් අභිජනන ඒකකය ස්ථාපන කිරීම සඳහා රු.මි.10 ක සම්පූර්ණ ප්‍රතිපාදන ප්‍රමාණයම ලබාදී ඇතත් සමාලෝචිත වර්ෂය අවසාන වන විට එහි භෞතික ප්‍රගතිය සියයට 50ක් වැනි අඩු මට්ටමක පැවතුණි.කෘතිම සිංචන උපකරණ මිලදී ගැනීම සඳහා රු.මි.10 ක සම්පූර්ණ ප්‍රතිපාදන ප්‍රමාණයම ලබාදී ඇතත් සමාලෝචිත වර්ෂය අවසාන වන විට එහි භෞතික ප්‍රගතිය සියයට 40ක් වැනි අඩු මට්ටමක පැවතුණි.තවද අභිජනන ගොවිපලවල් ඉදිකිරීම ව්‍යාපෘතිය යටතේ උතුරුමැද පළාතෙහි නිකවැරටිය ප්‍රදේශයේ වන්නිගම ගොවිපළෙහි එළු අභිජනන ඒකකයක් ඉදිකිරීම හා අභිජනන රැළ සඳහා සතුන් මිලදී ගැනීම සඳහා රු.මි.7.5ක ප්‍රතිපාදන හා, දකුණු පළාතෙහි මාතර කැකුණදුර ගොවිපළෙහි එළු අභිජනන ඒකකයක් ඉදිකිරීම, අභිජනන එළුවන් මිලදී	තිරප්පනේ ගොවිපළෙහි එළු අභිජනන ඒකකයක් පිහිටුවීම සඳහා වෙන් වූ ප්‍රතිපාදන වන රු. 3,090,000ක් (පරිපාලන වියදම් සහිතව) හා සහිවාල් අභිජනන ඒකකයක් පිහිටුවීම සඳහා වෙන් වූ ප්‍රතිපාදන වන රු.10,300,000 (පරිපාලන වියදම් සහිතව), 2024.12.03 වන දින උතුරු මැද පළාත් ප්‍රධාන ලේකම් වෙත නිදහස් කර ඇත. එම ප්‍රතිපාදන සම්බන්ධයෙන් ගත් ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් උතුරු මැද පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ 2025.03.04 දිනැති ලිපිය මඟින් දැනුවත් කර ඇත. කෘත්‍රිම සිංචන උපකරණ මිලදී ගැනීම සඳහා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව වෙත රු.මිලියන 10 ක ප්‍රතිපාදන ලබා දී තිබූ අතර ඉන් රු. මිලියන 3.8 වැය කොට කෘත්‍රිම සිංචන උපකරණ මිලදී ගෙන ඇත. ඉතිරි රු. මිලියන 6.2 යොදා නැවත කෘත්‍රිම සිංචන උපකරණ මිලදී ගැනීමට තීරණය කල නමුත් මිල ගණන් කැඳවා මිලදී ගැනීම් කිරීමට කාලය ප්‍රමාණවත් නොමැති බව දන්වා 2024.12.18 දින ඉතිරි ප්‍රතිපාදන නැවත හරවා එවා ඇත. වන්නිගම ගොවිපලෙහි එළු අභිජනන ඒකකය ස්ථාපිත කිරීමට අදාළ අනුමැතිය ලබා දී තිබුනද, අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇති ඇස්තමේන්තුව හා එළු නිවාස සැලැස්ම නැවත සංශෝධනය විය යුතු බවත් එම සංශෝධිත ඇස්තමේන්තුව හා එළු නිවාස සැලැස්ම ලබා ගැනීම ප්‍රමාද වීම හේතුවෙන් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට නොහැකි	ව්‍යාපෘති සැලසුම් කිරීමට හා අපේක්ෂිත කාර්යය සාධන මට්ටම් ළඟාකර ගැනීමට කටයුතු කළ යුතුය.

ගැනීම,සත්ත්ව ආහාර සඳහා තෘණ ශාක රෝපණය හා උපකරණ මිලදී ගැනීම සඳහා රු.මි.5.25 ක් ද ප්‍රතිපාදන ලබාදී සමාලෝචිත වර්ෂය අවසාන වන විට එම ගොවිපල දෙකෙහි ව්‍යාපෘති කටයුතු ආරම්භ කිරීමට පවා අපොහොසත් වී තිබුණි. ඒ අනුව අභිජනන ගොවිපලවල් ඉදිකිරීමේ ව්‍යාපෘතිය යටතේ ඇති උක්ත උප ව්‍යාපෘතීන්හි භෞතික ප්‍රගතිය සමස්ථයක් වශයෙන් සියයට 24 ක් වැනි ඉතා අඩු මට්ටමක පවතින බව නිරීක්ෂණය විය.	බව වයඹ පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ විසින් 2024.11.28 වන දින දන්වා ඇත. කැකුණදුර පුහුණු මධ්‍යස්ථානයේ එළු අභිජනන ඒකකයක් පිහිටුවීම සඳහා රු.මිලියන 5.25ක් මුදලක් අනුමත වූවද අත්තිකාරම් ලබා දීමේ ප්‍රමාදය හේතුවෙන් පළාත් නිශ්චිත ප්‍රතිපාදන මගින් සිදුකරන බව දකුණු පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ විසින් 2024.12.09 දින දන්වා ඇත.	

4.2 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2017 හා 2018 වර්ෂයන් වලදී වැඩ ආරම්භ කර 2024 දෙසැම්බර් 31 දින වන විට පිළිවෙලින් රු.මිලියන 279.8 ක්, රු.මිලියන 304 ක් හා රු.මිලියන 191 ක් වැයකර මඩකලපුව, වවුනියාව හා යාපනය විශේෂිත ආර්ථික මධ්‍යස්ථානයන්හි ඉදිකිරීම් අවසන් කර තිබුණද මෙම වාර්තාවේ දින වන විටත් එම ආර්ථික මධ්‍යස්ථාන විවෘත කර නොතිබුණි.	මෙම ආර්ථික මධ්‍යස්ථානවල කළමනාකරණ භාරය සඳහා අදාළ සාමාජිකයන් පත් කිරීම සිදු කර ඇත. නමුත්, මේ වනවිට අංක 2403/53 දරණ 2024.09.27 දිනැති ඇති විශේෂ ගැසට් පත්‍රය මගින් විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන වල කාර්යභාරය වෙළඳ,වාණිජ,ආහාර සුරක්ෂිතතා, සමුපකාර සංවර්ධන,කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය වෙත පවරා ඇත. අදාළ අමාත්‍යාංශය තවමත් මෙම විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන ආරම්භ කර නොමැති බව දන්වා ඇත.	ආර්ථික මධ්‍යස්ථාන කඩිනමින් විවෘත කළ යුතුය.

4.3 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	අමාත්‍යාංශයේ පශු සම්පත් අංශය මගින් කුඩා හා මධ්‍ය පරිමාණ පශු සම්පත් සංවර්ධන (යටිතල පහසුකම් සංවර්ධනය) ව්‍යාපෘතිය යටතේ කුකුළු ගොවිපොළ සංවර්ධනය කිරීම යන ක්‍රියාකාරකම යටතේ අවම පිරිවැයකින් උසස් තත්ත්වයේ කුකුළු පැටවුන් සහ කුකුළු මස් හා බිත්තර නිෂ්පාදනය ඉහළ නැංවීම හා සූර්ය බලශක්තිය භාවිතය තුළින් පොසිල ඉන්ධන සඳහා වැය වන පිරිවැය අවම කිරීමේ අරමුණින් ක්‍රියාත්මක යාපනය අච්චුවේලි ගොවිපොළේ සූර්ය පැනල ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය සඳහා	2024.02.28 දින අදාල ව්‍යාපෘති වාර්ථාව සහ BOQ අමාත්‍යාංශය වෙත යොමු කරන ලෙස උතුරු පළාත් අධ්‍යක්ෂ වෙත දන්වා එය ප්‍රමාදකර 2024.05.29 දින පළාත් අධ්‍යක්ෂක විසින් අමාත්‍යාංශය වෙත ව්‍යාපෘති වාර්තාව යොමු කර තිබුණි.2024.05.30 දින ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ විදුලි ඉංජිනේරු විසින් ලබා දුන් වියදම් ඇස්තමේන්තුව අමාත්‍යාංශය වෙත යොමු 2024.07.04 එම ඇස්තමේන්තුවට අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව පළාත් පරිපාලනය විසින් ව්‍යාපෘතිය 2024 වසර තුල නිම කරන ලෙස පළාත් අධ්‍යක්ෂක වෙත දන්වා එම ව්‍යාපෘතිය පළාත්අධ්‍යක්ෂක විසින් 2024.12.25	ශක්‍යතා අධ්‍යනයක් සිදුකර අපේක්ෂිත කාර්යය සාධන මට්ටම් ළඟාකර ගත හැකි ව්‍යාපෘති ආරම්භ කළ යුතුය.

	2024 වර්ෂය තුළ රු.මිලියන 5 ක මූල්‍ය ප්‍රතිපාදන වෙන්කර තිබුණද, ව්‍යාපෘතිය සැළසුම් කිරීම දුර්වල මට්ටමක පැවති බවත් ව්‍යාපෘතිය කාර්යක්ෂමව හා ඵලදායීව ක්‍රියාත්මක වී නොමැති බවත් නිරීක්ෂණය විය.	වන විට එම ව්‍යාපෘතිය සිදු කර අවසන් කරන බව සඳහන් කරන ලදී. එහෙත් ඒ පිළිබඳව ලිඛිත ලියවිල්ලක් නොමැති බැවින් 2024.12.19 දින අමාත්‍යාංශය විසින් පළාත් අධ්‍යක්ෂක වෙත මෙම ව්‍යාපෘතිය පිළිබඳව විමසා සිටි අතර එම දින පළාත් අධ්‍යක්ෂක විසින් 2024.12.24 දින එම ව්‍යාපෘතිය සිදු නොකරන බව අමාත්‍යාංශය වෙත කරුණු සහිතව පළාත් අධ්‍යක්ෂ විසින් ලිපියක් යොමු කර තිබුණි.2024 වසර තුළ මෙම ව්‍යාපෘතිය නිම කිරීමට නොහැකි විය.	
(ආ)	අමාත්‍යාංශයේ පශු සම්පත් අංශය මගින් 2024 ක්‍රියාකාරී සැලැස්මෙහි කිරි සංවර්ධන ව්‍යාපෘතිය යටතේ සියළු පළාත් ආවරණය වන පරිදි පශු සම්පත් ක්ෂේත්‍රය සම්බන්ධයෙන් දත්ත රැස් කිරීමේ පද්ධතියක් ස්ථාපනය කිරීමට සහ කිරි නිෂ්පාදන ඒකක ස්ථාපනය කිරීම සඳහා රු.මිලියන 48.52 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණද සමාලෝචිත වර්ෂය තුළ එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි.	මෙයට සමාන දත්ත පද්ධතියක් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් “Geo Goviya” නමින් ආසියානු සංවර්ධන බැංකුවේ “ආහාර සුරක්ෂිතතාව සහ ජීවනෝපාය ප්‍රකෘතිමත් කිරීමේ හදිසි ආධාර “ව්‍යාපෘතියේ ආධාර මත ස්ථාපනය කිරීමට යෝජිත බව ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව විසින් එවන ලද 2024.07.17 දිනැති ලිපිය මගින් දැනුම් දී ඇති අතර පශු සම්පත් අංශයට අදාළ දත්ත පද්ධතිය ද මෙම පද්ධතියටම ඒකාබද්ධව එම ව්‍යාපෘතිය යටතේම ස්ථාපනය කරන ලෙස ද ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව මගින් යෝජනා කරන ලදි. ඒ අනුව පද්ධති දෙක ඒකාබද්ධව ක්‍රියාත්මක කිරීමට තීරණය වූ අතර “Geo Goviya” ව්‍යාපෘතිය සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණවත් නොමැති බැවින් ඒ සඳහා අමතර ප්‍රතිපාදන ලෙස පශු සම්පත් අංශය විසින් වෙන් කර ඇති රුපියල් මිලියන 48.52ක ප්‍රතිපාදනය යොදා ගැනීමට යෝජනා විය. නමුත් මුදල් වර්ෂය අවසානය තෙක් අමතර ප්‍රතිපාදන වල අවශ්‍යතාවය පිළිබඳ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් අප වෙතින් විමසීමක් නොකළ අතර පශු සම්පත් ක්ෂේත්‍රය සම්බන්ධයෙන් දත්ත එකතු කිරීමේ පද්ධතිය සහ කිරි නිෂ්පාදන ඒකක ස්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට නොහැකි බව හා එම ප්‍රතිපාදනය සඳහා අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කරන මෙන් දන්වා මෙම අමාත්‍යාංශයේ සැලසුම් අංශයේ අධ්‍යක්ෂ ජනරාල් වෙත 2024.11.04 දින ලිපියක් යොමු කර ඇත. එමෙන්ම වෙන් කර ඇති ප්‍රතිපාදන නැවත පවරා ගැනීම සිදු කරන ලෙස දන්වා එවා තිබේ.	ශක්‍යතා අධ්‍යයනයක් සිදුකර අපේක්ෂිත කාර්යය සාධන මට්ටම් ළඟාකර ගත හැකි ව්‍යාපෘති ආරම්භ කළ යුතුය.

(ඇ)	අමාත්‍යාංශයේ ග්‍රාමීය ආර්ථික අංශය මගින් ගෘහාශ්‍රිත එළුවන් ඇතිකිරීමේ ව්‍යාපෘතිය සඳහා 2023 වර්ෂයේ රු.මිලියන 150 ක් ද 2024 වර්ෂයේ රු.මිලියන 200 ක් ද වශයෙන් ප්‍රතිපාදන වෙන්කර ඇති අතර ඉන් රු.මිලියන 33 ක ප්‍රතිපාදන එනම් සියයට 16 ක ප්‍රමාණයක් හම්බන්තොට දිස්ත්‍රික්කය සඳහා වෙන්කර තිබුණි.ව්‍යාපෘතිය ක්‍රියාත්මක දිස්ත්‍රික්ක 21 අතරින් එක් දිස්ත්‍රික්කයක් සඳහා හිමිවන ඉහළම ප්‍රතිපාදනය එම දිස්ත්‍රික්කයට හිමි වී තිබුණු නමුත් හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් විසින් යොමුකරන ලද අංක DSH/DAD/06/27-1 හා 2024.10.30 දිනැති ලිපිය මගින් මිල ගණන් කැඳවීමේදී නීරෝගී ගුණාත්මක එළුවන් මිල දි ගැනීමට සුදුසු සැපයුම්කරුවන් ආසන්නතම ප්‍රදේශවලින් සොයාගැනීමට නොහැකිවීම, 2023 වර්ෂයේ මිල දි ගත් එළුවන් සම්බන්ධයෙන් ගැටලු පැනනැගීම, විවිධ හේතූන් මත එළුවන් මියයාම හා රෝගී වූ විට ප්‍රතිකාර කිරීමට හා මරණයට පත් වූ විට මරණ පරික්ෂණයට රැගෙන යාමට ප්‍රතිලාභියාට අධික වියදමක් දැරීමට සිදුවීම යන හේතු මත ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් ව්‍යාපෘතිය ක්රියාත්මක කළ නොහැකි බව දන්වා එම රු.මිලියන 33 ක ප්‍රතිපාදන අතුරින් රු.29,911,500 ක ප්‍රතිපාදන ආපසු කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත එවා ඇත.ඒ අනුව ප්‍රතිපාදන වෙන්කරන ආකාරය හා අදාළ ප්‍රදේශ තෝරාගන්නා ආකාරය සම්බන්ධව විධිමත් සැලසුමකින් තොරව කටයුතුකර ඇති බව විගණනයේද නිරීක්ෂණය විය.	මෙම ව්‍යාපෘතිය යටතේ දිස්ත්‍රික්ක වලට ප්‍රතිපාදන වෙන් කිරිමේදී සුවිශේෂී ප්‍රමුඛතා,සත්ව පාලනය කිරීමේ වැඩි ප්‍රවණතාවයක් පවතින ප්‍රදේශ,භූගෝලීය පිහිටීම සුදුසු ප්‍රදේශ,අඩු ආදායම් ලාභී ග්‍රාමීය ජනතාව වැඩි වශයෙන් ජීවත්වන ප්‍රදේශ සහ ගරු ඇමතිතුමා සහ රාජ්‍ය ඇමතිතුමා විසින් ලබා දුන් උපදෙස් ද අනුගමනය කරමින් කටයුතු කර ඇත.ශ්‍රී ලංකාවේ ඇති දිළිඳුම දිස්ත්‍රික්ක අතරින් හම්බන්තොට දිස්ත්‍රික්කයට වැඩි ප්‍රමුඛතාවයක් හිමිවේ.ඒ අනුව,අඩු ආදායම්ලාභී දිස්ත්‍රික්කයක් ලෙස ප්‍රදේශයේ අවශ්‍යතාවය සළකා 2023 වර්ෂය සඳහා රු.මි.18 ක ප්‍රතිපාදන ලබා දී ඇත. 2023.12.31 දිනට මෙම ව්‍යාපෘතිය සඳහා දිස්ත්‍රික්කයෙන් වාර්තා වූ ප්‍රගතිය අනුව ප්‍රතිලාභීන් 233 ක් සඳහා එළුවන් 699 ක් බෙදා දී ඇත. ඒ සඳහා වියදම් කළ මුදල රු.මිලියන 17.096 කි. ඒ අනුව පිළිවෙලින් භෞතික ප්‍රගතිය හා මූල්‍ය ප්‍රගතිය සියයට 100 හා සියයට 95 ලෙස දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් email මඟින් ලබා දෙන ලද ප්‍රගති වාර්තාවේ සඳහන් කර තිබුණි. තව ද, 2024 වර්ෂය සඳහා ප්‍රතිපාදන වෙන්කිරීමේ දී පසුගිය වසර වල සාර්ථකව ව්‍යාපෘතිය ක්‍රියාත්මක වූ දිස්ත්‍රික්ක සඳහා වැඩි අවධානයක් යොමු කරන ලදි. ඒ අනුව ඉහත කරුණු ද සැලකිල්ලට ගනිමින් හම්බන්තොට දිස්ත්‍රික්කය සඳහා 2024.03.12 දිනැතිව 2024 වර්ෂයේ ප්‍රතිපාදන වලින් රු.මි.33 ක් වෙන් කරන ලදි. නමුත් හම්බන්තොට දිස්ත්‍රික්කයේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ අපහසුතාවය දක්වමින් දිස්ත්‍රික් ලේකම්ගේ අංක DSH/DAD/06/27-1 හා පිළිවෙලින් 2024.10.30 හා 2024.12.26 දිනැති ලිපි මඟින් රු.29,911,500 හා රු.2,815,200 ක ප්‍රතිපාදන නැවත ආපසු හරවා එවා තිබුණි. තවද 2024 වර්ෂයේ ව්‍යාපෘති ක්‍රියාත්මක වීම ප්‍රමාදවීමට පශු වෛද්‍යවරුන්ගේ වෘත්තීය ක්‍රියාමාර්ග සහ එම වර්ෂය තුළ මැතිවරණ දෙකක් පැවැත්වීමද හේතුවූ බව නිරීක්ෂණය විය. නමුත් මෙම වර්ෂය සඳහා ප්‍රතිපාදන ලබා දුන් අනෙකුත් දිස්ත්‍රික්කවල ව්‍යාපෘතිය සාර්ථකව ක්‍රියාත්මක වී ඇත. මෙම ව්‍යාපෘතියේ 2024 වර්ෂය සඳහා සමස්ත භෞතික ප්‍රගතිය සියයට 88 ද මූල්‍ය ප්‍රගතිය සියයට 86 ද වේ.	විධිමත් ව්‍යාපෘති සැලැස්මක් පිළියෙල කර එය අධීක්ෂණය කර අපේක්ෂිත කාර්යය සාධන මට්ටම් ළඟාකර ගැනීමට කටයුතු කළ යුතුය.

4.4 කාල පමාවකින් පසුව වැඩ ආරම්භ කළ ව්‍යාපෘති

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
අමාත්‍යාංශයේ පශු සම්පත් අංශය මධ්‍යකාලීන පශු සම්පත් සංවර්ධන වැඩසටහන යටතේ පේදුරුතුඩුව පශු වෛද්‍ය කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීමට 2022 වර්ෂයේදී ආරම්භක අත්තිකාරම හා පළමු බිල්පතට අදාළව රු.මිලියන 6.82 ක් ගෙවීම් කර තිබුණි. ගොඩනැගිලි අමුද්‍රව්‍ය හිඟය හා මිල ඉහළ යාම හේතුවෙන් කොන්ත්‍රාත්කරුගේ ඉල්ලීම මත අවිධිමත් ලෙස ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව අවසන් කර තිබුණි.ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් නොගෙන එම ගොඩනැගිල්ල ඉදිකිරීමේ දෙවන අදියර වශයෙන් 2024 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත්කර ඒ සඳහා රු.මිලියන 58.25 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණි.සමාලෝචිත වර්ෂයේ අපේක්ෂිත මූල්‍ය ප්‍රගතිය හා භෞතික ප්‍රගතිය සියයට 100 ක් වුවද සමාලෝචිත වර්ෂය අවසාන වන විට උක්ත ව්‍යාපෘතිය සඳහා කොන්ත්‍රාත්කරු වෙත රු.මිලියන 10.7ක අත්තිකාරම් මුදලක් ගෙවා තිබුණු අතර භෞතික ප්‍රගතිය සියයට 3 ක් වැනි ඉතා අඩු මට්ටමක පවතින බවත් නිරීක්ෂණය විය.	2021.12.26 දින ගිවිසුම් අත්සන් කර 2021 වසර සඳහා තාවකාලිකව නතර කර ඇත. 2022 පළමු කාර්තුව තුළ දී රු.මිලියන 6.82ක එනම් සියයට 32 ක මූල්‍ය ප්‍රගතියක් අත් කර ගෙන තිබුණි.එවකට පැවති ගොඩනැගිලි අමුද්‍රව්‍ය හිඟය සහ මිල ඉහළ යෑම හේතුවෙන් කොන්ත්‍රාත්කරුගේ ඉල්ලීම මත සහ 2022.04.26 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 හි 03 III වගන්තිය මඟින් ලබා දී ඇති උපදෙස් අනුව දෙපාර්ශවයේ එකඟතාවය මත අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය මත ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව විධිමත්ව අවසන් කර ඇත.අමාත්‍යාංශ ලේකම්ගේ උපදෙස් මත නව ඇස්තමේන්තුවක් 2023 වර්ෂයේදී ලබාගෙන 2023 වර්ෂයට අදියර I සඳහා රු. මිලියන 25 ක් සහ 2024 වර්ෂය අදියර II සඳහා රු.මිලියන 27.978 ක් ලෙස ඇස්තමේන්තු කර රු.මිලියන 25 ක් අයවැය ප්‍රතිපාදනවලින් අඩු කරන ලෙස රාජ්‍ය වියදම් සමාලෝචන කමිටු (PERC) නිර්දේශය මත මෙම ඉදිකිරීම් කටයුතු 2023 වර්ෂයට අදාළව තාවකාලිකව අත්හිටුවන ලදී.2024 වසරේදී රු.මිලියන 60 ක ප්‍රතිපාදන වෙන් කර උතුරු පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මඟින් ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර සංශෝධිත ඇස්තමේන්තුවක් කෘෂිකර්ම අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ (ඉංජිනේරු) විසින් ලබාදුන් ආකෘතියට අනුව උතුරු පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ, පළාත් අධ්‍යක්ෂ එවා තිබුණි. ඒ අනුව අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබාගැනීමෙන් අනතුරුව මෙම ඉදිකිරීමට අදාළව 2024.08.24 දින පුවත්පත් දැන්වීමක් මඟින් ලංසු කැඳවා උතුරු පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව සහ කෝනේස් කන්ස්ට්‍රක්ෂන් (Kones Construction) අතර ගිවිසුමට 2024.10.29 දින අත්සන් තබා ඇත. වැට් රහිත කොන්ත්‍රාත් මුදල රු.36,726,022 කි.ආරම්භක අත්තිකාරම ලෙස (වැට් සහිත) රු.10,737,696 ක මුදලක් උතුරු පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව 2024.11.18 දිනැති ලිපිය මඟින් ඉල්ලා ඇතත් ITMIS පද්ධතිය තුළ පැවති තාක්ෂණික අපහසුතාවය මඟහරවා ගැනීම සඳහා, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවෙන්	ව්‍යාපෘති සැලැස්ම පිළියෙල කිරීම හා අපේක්ෂිත කාර්යය සාධන මට්ටම් ළඟාකර ගත යුතු අතර පරීක්ෂාව සිදුකර ප්‍රතිපාදන නිදහස් කළ යුතුය.

		අදාළ මුදල ලබාගැනීම සඳහා 2024.12.06 දිනැති ලිපිය මඟින් උතුරු පළාත් ප්‍රධාන ලේකම් වෙත රු.10,750,000 ක ප්‍රතිපාදන වෙන් කර දී ඇත. ඒ අනුව එම අත්තිකාරම් මුදල කොන්ත්‍රාත්කරු වෙත 2024.12.18 දින ගෙවීම් කර ඇතත්, 2024 වසරේ දී සැලකිය යුතු මට්ටමේ භෞතික ප්‍රගතියක් අත්කර ගැනීමට ප්‍රමාණවත් කාලයක් නොතිබුණි.මේ වන විට සියට 20 ක භෞතික ප්‍රගතියක් අත්කරගෙන ඇත. පළමු බිල්පත වශයෙන් රු.2,763,176 ක ද බිල්පතක් ඉදිරිපත් කර ඇත.	

4.5 වෙනත් නිරීක්ෂණ

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	අමාත්‍යාංශයේ ග්‍රාමීය ආර්ථික අංශය මධ්‍යම පළාතේ ග්‍රාමීය ප්‍රදේශවල ජීවත්වන ජනතාවගේ ජීවනෝපාය නඟා සිටුවීම සඳහා යෝජිත ගෘහාශ්‍රිත එළුවන් ඇතිකිරීමේ ව්‍යාපෘතිය සඳහා උපදෙස් - 2024 මැයෙන් ඉදිරිපත් කර ඇති උපදෙස් මාලාවේ සඳහන් පරිදි වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී අනුගමනය කළ යුතු නිර්ණායකයන් අනුව එළුවන් ලබාදීමට පෙර ප්‍රතිලාභීන් විසින් තම පෞද්ගලික වියදමින් එළුමඩුව සකස් කරගත යුතු නමුත් එම මඩුව ඉදිකිරීමේදී සැලකිය යුතු පිරිවිතර හා ප්‍රමිතීන් කවරේද යන්න අදාළ උපදෙස් මාලාවේ ඇතුළත් කර නොතිබුණි.ඒ අනුව මාතලේ දිස්ත්‍රික්කයට අයත් ගලේවෙල, නාවුල, විල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල හා නුවරඑළිය දිස්ත්‍රික්කයේ නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ එළුගාල නිසිපරිදි ඉදිකර නොමැති වීම හේතුවෙන් අයදුම්කරුවන් ප්‍රතික්ෂේප වී තිබුණු අතර එලෙස එළුගාල ඉදිකිරීම සම්බන්ධ පිරිවිතර ඉදිරිපත් නොමැති විටෙක එලෙස ප්‍රතික්ෂේප කිරීමට බලපෑ හේතු කවරේද යන්න විගණනයට ඉදිරිපත් නොවිය.	පිළිතුරු ලබා දී නොමැත.	ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අදාළ පිරිවිතර හා ප්‍රමිතීන් නිශ්චිතව දැක්වීමට කටයුතු කළ යුතුය.

(ආ)	අමාත්‍යාංශයේ පශු සම්පත් අංශය ධාරිතාව ගොඩනැගීමේ ව්‍යාපෘතිය (Capacity Building) යටතේ නිලධාරීන්, තරුණ ව්‍යවසායකයින් සහ ගොවීන් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම සහ පශු සම්පත් ප්‍රතිපත්තිය සකස් කිරීම යන වැඩසටහන සඳහා සමාලෝචිත වර්ෂය වෙනුවෙන් රු.මිලියන 2.06 ක ප්‍රතිපාදන වෙන්කර ඒ ව්‍යාපෘතිය යටතේ පුහුණුවීම්, ඉලක්කගත වැඩසටහන් සහ වැඩසටහන් ප්‍රමාණය පිළිබඳව වාර්ෂික සැලැස්මෙහි සඳහන් කිරීමෙන් තොරව සමාලෝචිත වර්ෂය අවසාන වන විට ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සියයට 26 ක් වශයෙන් දක්වා ඇතත් ඉලක්කගත වැඩසටහන් ප්‍රමාණය සඳහන් කිරීමකින් තොරව භෞතික ප්‍රගතිය ගණනය කිරීම කර තිබූ බව විගණනයේදි නිරීක්ෂණය විය.	ධාරිතා සංවර්ධන ව්‍යාපෘතියේ අනුමත ක්‍රියාකාරී සැලැස්මට අනුව නිළධාරීන්ට හා ගොවීන්ට පුහුණු වැඩසටහන් පැවැත්වීමට සැලසුම් කොට පශු සම්පත් ප්‍රතිපත්තීන් සංවර්ධනයද මෙම ව්‍යාපෘතියට අදාළ විය.ඒ අනුව මෙම ව්‍යාපෘතිය යටතේ තෝරා ගත් පළාත් වල මී කිරි නිෂ්පාදකයින් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීමට සැලසුම් කොට තිබුණු අතර වයඹ පළාතේ ප්‍රතිලාභීන් 42 හට මෙම පුහුණු වැඩසටහන අත්තිකාරම් ලබා නොගෙන පැවැත්වූවද අනෙකුත් තෝරාගත් පළාත් එසේ සිදු කිරීමට නොහැකි බව වාචිකව දන්වා ඇත. තවද මෙම ව්‍යාපෘතිය යටතේ පශු සම්පත් ප්‍රතිපත්ති සම්පාදනයට අදාළ සාකච්ඡා හා ක්ෂේත්‍ර කටයුතු සඳහා ද මෙම ව්‍යාපෘතිය යටතේ ක්‍රියාකාරකම් සිදුවූ අතර ඒ සඳහා ප්‍රතිපාදන යොදවා ඇත.එමෙන්ම වසර අවසානයේ දී පළාත් මට්ටමින් සිදුකල පශු සම්පත් සංවර්ධන ව්‍යාපෘති අධීක්ෂණයට හා පසු විපරම් කටයුතු වෙනුවෙන් නිළධාරීන් ක්ෂේත්‍රයට යාමද මෙම ව්‍යාපෘති ප්‍රතිපාදන යටතේ සිදුවිය.	ව්‍යාපෘතිය තුළින් අපේක්ෂිත ඉලක්කගත වැඩසටහන් ප්‍රමාණය වාර්ෂික සැලැස්මෙහි දක්වා ඒ අනුව ඒවා ක්‍රියාත්මක කළ යුතුය.

4.6 දේශීය අරමුදල්වලින් ක්‍රියාත්මක කළ ව්‍යාපෘති

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	Good Animal Husbandry Practice and Establishment of Modern Farm ව්‍යාපෘතිය යටතේ බස්නාහිර පළාත තුළ තෝරාගෙන සිටි ප්‍රතිලාභීන් 05 දෙනෙකු සම්බන්ධයෙන් 2024.12.11 හා 2024.12.17 දිනයන්හිදී සිදුකරන ලද ක්ෂේත්‍ර පරීක්ෂාවේදි එම ප්‍රතිලාභීන්ට මූල්‍ය ආධාර ලබාදීමේ මූල්‍ය ප්‍රගතිය ශුන්‍ය බව නිරීක්ෂණය විය.2025 පෙබරවාරි 03 දින වන විට අදාළ ව්‍යාපෘතීන් නිමකර ඇතත් ඊට අදාළ මූල්‍ය ආධාර ඔවුන් වෙත ලැබී නොතිබුණි. එක් ප්‍රතිලාභියෙකු සඳහා රු.500,000 ක චෙක්පතක් බස්නාහිර පළාත් සභාවේ ප්‍රධාන ලේකම්ගේ නමට 2024.11.29 දින නිකුත්කර එම පළාත් සභාව එම වටිනාකම වෙනුවෙන් නැවතත් බස්නාහිර පළාත් අධ්‍යක්ෂ නමට 2024.12.24 දින චෙක්පතක් නිකුත්කර පළාත් අධ්‍යක්ෂකගේ ගිණුමෙහි 2024.12.27 දින තැන්පත් වී තිබුණද ප්‍රතිලාභියාට මුදල් ලැබී නොතිබුණි. බස්නාහිර පළාත සඳහා වෙන්කර තිබූ මුළු ප්‍රතිපාදන වටිනාකම රු.මිලියන 2.5 ක් වූ අතර ඉන් ඉතිරි වූ ප්‍රතිපාදන රු.මිලියන 2 ක් සහ එම ව්‍යාපෘතියෙහි අධීක්ෂණ, ඇගයීම් හා පරිපාලන වියදම් වෙනුවෙන් රු.75,000 ක් ඇතුළුව රු.මිලියන 2.075 ක් 2024.12.05 දින බස්නාහිර පළාත් සභාවට වෙන් කර දී	පුද්ගලයින් වෙත ගෙවීම සඳහා ප්‍ර.ලේ. වෙත යොමුකරන ලද චෙක්පත් නැවත ගිණුම් අංශය වෙත ලැබී 2025 ජනවාරි මස අදාල පශු වෛද්‍ය කාර්යාල වෙත යොමුකර ඇත.	ප්‍රතිලාභීන් වෙත නියමිත කාලය තුළ ප්‍රතිලාභ ලැබෙන පරිදි ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලන ක්‍රියාවලිය ක්‍රියාත්මක කළ යුතුය.

	තිබුණි.නිකුත්කරන ලද චෙක්පත් පළාත් අධ්‍යක්ෂකගේ ගිණුමෙහි 2024.12.27 දින තැන්පත් වී තිබූ අතර ප්‍රතිලාභීන්ට හිමිවිය යුතු මුදල් සඳහා ප්‍රතිලාභීන්ගේ නමට චෙක්පත් නිකුත් නොකර පළාත් අධ්‍යක්ෂකගේ ගිණුමෙහි මසකට අධික කාලයක් රඳවා තබාගෙන සිට ඇති බවට විගණනයේදී නිරීක්ෂණය විය.		
(ආ)	Quality Improvement of Milk and Milk Products ව්‍යාපෘතිය යටතේ කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික්ක තුළින් ප්‍රතිලාභීන් 09 කට වෙන්කල මුදල රු.2,888,036 ක් වූ අතර ක්ෂේත්‍ර පරීක්ෂාවන් සිදුකරන ලද 2025 පෙබරවාරි 05 දිනය වනවිට එම ව්‍යාපෘතීන් නිමකර තිබුණද ප්‍රතිලාභීන්ට මූල්‍ය ආධාර ලබාදීමේ මූල්‍ය ප්‍රගතිය ශුන්‍ය වී තිබුණි.පසුව ඒ පිළිබඳව සිදුකළ පසුවිපරමේදී ප්‍රතිලාභීන් 08 දෙනෙකු වෙත මූල්‍ය ආධාර ලැබී නොතිබුණි. ප්‍රතිලාභීන් 04 දෙනෙකුට රු.1,209,190 ක් වටිනා චෙක්පත් අමාත්‍යාංශය විසින් බස්නාහිර පළාත් සභාවේ ප්‍රධාන ලේකම්ගේ නමට නිකුත්කර එම වටිනාකමට අදාළව බස්නාහිර පළාත් අධ්‍යක්ෂ නමට 2025.12.31 දිනට පෙර නිකුත්කළ චෙක්පතක් මඟින් අදාළ මුදල් පළාත් අධ්‍යක්ෂගේ ගිණුමෙහි තැන්පත්කර 2025 පෙබරවාරි 05 දිනවන විටත් එම මුදල් අදාළ ප්‍රතිලාභීන් වෙත නොගෙවා මසකට අධික කාලයක් බස්නාහිර පළාත් අධ්‍යක්ෂගේ ගිණුමෙහි රඳවාගෙන සිට ඇති බවට නිරීක්ෂණය විය.තාක්ෂණික නිලධාරී විසින් 2024.12.04 දින සහතික කරන ලද රු.500,000 ක වියදම ඇතුළත් වවුචරපත අමාත්‍යාංශය වෙත 2025.01.01 දින ලැබී 2024 වර්ෂයේ බැඳීමක් ලෙස දක්වා එම වටිනාකමට අදාළව 2025.01.27 දින බස්නාහිර පළාත් සභාවේ ප්‍රධාන ලේකම්ගේ නමට චෙක්පතක් නිකුත්කර තිබුණි. තවද පිළිවෙලින් රු.253,846 ක් හා රු.100,000 ක් වෙන්කර තිබූ ප්‍රතිලාභීන් දෙදෙනෙකු වෙනුවෙන් අදාළ මුදල් නිදහස්කර නොතිබූ අතර ඊට හේතු වූ නිශ්චිත කරුණු විගණයට ඉදිරිපත් නොවුණි. ඒ අනුව මෙම උප ව්‍යාපෘතියෙහි කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික්කයන් තුළ ක්‍රියාත්මක වූ ව්‍යාපෘතීන්හි මූල්‍ය ප්‍රගතිය සියයට 11.25 ක් වැනි අවම මට්ටමක පැවතුණි.	ඉහත පිළිතුරම අදාළ වේ.	ප්‍රතිලාභීන් වෙත නියමිත කාලය තුළ ප්‍රතිලාභ ලැබෙන පරිදි ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලන ක්‍රියාවලිය ක්‍රියාත්මක කළ යුතුය.

4.7 වත්කම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	අමාත්‍යාංශයෙහි භාවිතයේ නොපවතින නමුත් CIGAS පරිගණක පද්ධතියේ ඇතුළත් වටිනාකම රු.116,711,920ක් වූ වාහන 12 ක සම්බන්ධයෙන් 2017 දෙසැම්බර් 21 දිනැති අංක 02/2017 දරන භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ වත්කම් කළමනාකරණ චක්‍රලේඛය අනුව කටයුතු කර නොතිබුණි.	මෙම වාහන පිළිබඳ හේතු සොයාබලා අවශ්‍ය පියවර ඉදිරියේදි ගනු ලැබේ.	අදාළ චක්‍රලේඛය ප්‍රකාරව අමාත්‍යාංශයෙහි භාවිතයේ නොපවතින වාහන සම්බන්ධයෙන් සොයාබලා කටයුතු කළ යුතුය.
(ආ)	අමාත්‍යාංශයේ කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික, පශු සම්පත් හා පොහොර අංශයන්ට අයත් වටිනාකම රු. 80,000,000 ක් වූ වාහන 06 ක් 2024 දෙසැම්බර් 31 දින වනවිටත් ධාවන කටයුතු සඳහා යොදා නොගෙන නිෂ්කාර්යව පැවතුණි.	මෙම වාහන පිළිබද හේතු සොයාබලා අවශ්‍ය පියවර ඉදිරියේදි ගනු ලැබේ.	සම්පත් ඵලදායී ලෙස උපයෝජනය කළ යුතුය.
(ඇ)	වර්ෂ ගණනාවක සිට අමාත්‍යාංශයේ JK-0194 හා JK-0188 අංක දරන බස් රථ 02 ක කාර්යාල ප්‍රවාහන ක්‍රමයට යොදවා ඇතත් එහි ගමන් ගන්නා නිලධාරීන් දෙදෙනෙකු විසින් එහි ගමන් කරන නිලධාරීන්ගෙන් වර්ෂ ගණනාවක සිට එකතු කරන ලද මුදල් වලින් අදාළ බස් රථවල ඉන්ධන වියදම් පියවා ගැනීමෙන් අනතුරුව 2025 ජුනි 30 දින වන විට රු.205,840 ක් හා රු.257,111 ක මුදලක් එම නිලධාරීන් අත ඉතිරිව පැවතුණි.එය රාජ්‍ය දේපලක් උපයෝජනය කිරීම මඟින් උපයා ගනු ලබන මුදල් ගණන්දීමේ නිලධාරී, ආදායම් ගණන් දීමේ නිලධාරීගේ හෝ ඔහු විසින් බලය පැවරූ නිලධාරියෙකුගේ පාලනයෙන් පරිබාහිරව භාවිතා වන බව විගණනයට නිරීක්ෂණය විය.	පිළිතුරු ලබා දී නොමැත.	රාජ්‍ය දේපළ උපයෝජනයෙන් ලැබෙන සියලුම ආදායම් පිළිබද විධිමත් ලේඛන පවත්වා ගනිමින් එම මුදල් රාජ්‍ය අදායමට බැරකල යුතුය.

4.8 පාඩු හා අත්හැරීම්

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	වාහන 09 කට අදාල වටිනාකම රු.5,946,308 ක් වූ සිද්ධි පාඩු හා අත්හැරීම් ලේඛනයේ ඇතුළත් කර තිබුණු නමුත් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි.	කෘෂිකර්ම අංශයේ පාඩු හා අත්හැරීම් ලේඛණයේ ඇතුලත් කර සිද්ධීන් පොත් වලින් කපා හැර ඇති බැවින් එම සිද්ධීන් මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් කර නොමැත. අදාල සිද්ධීන් කපා හැරීම සම්බන්ධ තොරතුරු අතපසු වීමකින් පාඩු හා අත්හැරීම් ලේඛණයේ ඇතුලත් කර	අලාභයේ වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කිරීමට කටයුතු කළ යුතුය.

		නොමැති අතර එම තොරතුරු පාඩු හා අත්හැරීම් ලේඛණයේ ඇතුලත් කර ගැනීමට කටයුතු කර ඇත.	
(ආ)	සමාලෝචිත වර්ෂය අවසාන දිනට අලාභය අයකර ගැනිම ප්‍රමාදවීම හෝ අයකර ගැනිමට අපොහොසත් විම මත සිද්ධීන් 38 කට අදාළව ඉදිරියට ගෙන එනු ලබන රු.21,049,464 ක අලාභයන් සඳහා මුදල් රෙගුලාසි 109 අනුව කටයුතු කර නොතිබුණි.	මු.රෙ.109 යටතේ කටයුතු කර නොමැති වාහන 04 ක අලාභහානී හානි පාඩු ලේඛනයෙන් ඉවත් කිරීම සඳහා ගිණුම් අංශය වෙත යොමු කර ඇත.වාහන 18 කට අදාලව මු.රෙ.104 (4) වාර්තා සකස් කර ඇති අතර අදාල ආකෘති පත්‍රය අනුව සකස් කර ලේකම්තුමාගේ අනුමැතියට ඉදිරිපත් කිරීමටද, වාහන 03 ක අනතුරු සම්බන්ධ අලාභය අයකර ගැනීම සඳහා අමාත්‍යාංශයේ නිති අංශය හරහා නීතිපති දෙපාර්තමේන්තුව වෙත නීතිමය කටයුතු සඳහා යොමු කර ඇත.අංක 251 – 3639 දරන වාහනයට රියදුරුගෙන් රජයට සිදුව ඇති අලාභය අයකර ගැනීමට කටයුතු කරමින් ඇත. අංක 252 – 3527,HB – 5572, 253 – 3919,GT – 2015,KS – 4826 දරන වාහන 06 ටහි අනතුරු වලට අදාල මු.රෙ.104 ගොනු ප්‍රවාහන අංශයේ නොමැත. වාහන 06 කට අදාලව මු.රෙ.104(1) හා 104 (4) පරීක්ෂණ කටයුතු සිදු කෙරෙමින් පවතින අතර එම පරික්ෂණ කටයුතු අවසන් වූ වහාම ඒ සම්බන්ධයෙන් ද මුදල් රෙගුලාසි 109 යටතේ කටයුතු කරනු ලැබේ.	මුදල් රෙගුලාසි 109 ප්‍රකාරව අලාභ ශේෂයන් සම්බන්ධයෙන් කටයුතු කළ යුතුය.
(ඇ)	2021 මාර්තු 21 දින අනතුරකට පත් වී වසර 03 මාස 09 ක් ඉක්ම ගියද සමාලෝචිත වර්ෂයේ අවසාන දින වන විටත් ධාවනයට සුදුසු තත්ත්වයකට පත් කර නොතිබුණු KW-8202 වාහනයේ අලාභය සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් කර නොතිබුණි.	KW 8202 දරණ රථයේ අනතුර සම්බන්ධයෙන් මු.රෙ.104 (4) යටතේ අලාභයන් පිළිබඳ අවසන් වාර්තාව ලබා ගැනීම සඳහා කමිටුවක් පත් කර ඇති අතර එම කමිටු වාර්තාව ලද පසු අලාභ මුදල මූල්‍ය ප්‍රකාශන වලට ඇතුලත් කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි.	අලාභයේ වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කිරීමට කටයුතු කළ යුතුය.
(ඇ)	2021 ජුනි 21 දින කාර්මික දෝෂයකට ලක් වී වසර 03 මාස 06 ක් ඉක්ම ගියද සමාලෝචිත වර්ෂයේ අවසාන දින වන විටත් ධාවනයට සුදුසු තත්වයට පත්කර නොතිබුණු ග්‍රාමීය ආර්ථික අංශයට අයත් CAV-5064 දරන වාහනයේ අලාභය මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි.	CAV 5064 ජීප් රථයේ කාර්මික දෝෂයට අදාල මු.රෙ.104(4) අවසන් වාර්තාව සකසා, අනුමැතිය සඳහා යොමු කර ඇත. එම වාර්තාව ලද පසු මෙම රථයේ අලාභ මුදල මූල්‍ය ප්‍රකාශන වලට ඇතුලත් කිරීමට කටයුතු කරනු ලැබේ.	අලාභයේ වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කිරීමට කටයුතු කළ යුතුය.

(ඉ) පෙර වර්ෂයන්හි සිදුවූ අනතුරු දෙකකට අදාළව සහ භාණ්ඩ සඳහා වූ එක් අනතුරකට අදාළ එකතු වටිනාකම රු.377,911 ක් වූ අලාභයන් අයකර ගැනීමට අපොහොසත්ව ඇතත් සමාලෝචිත වර්ෂයේදී පොත් වලින් කපා හැරීමට කටයුතු කර තිබුණි.	වගකිව යුතු නිළධාරියකු නොමැති බැවින් අයකිරීමක් සිදුකල නොහැකි බැවින් මු.රෙ.109 යටතේ පොත්වලින් කපාහැරීමට කටයුතු කර ඇත.	අලාභයන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

4.9 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම

විගණන විමසුම් පිළිබඳ විස්තරය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
මුදල් රෙගුලාසි 155 ප්‍රකාරව ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා විසින් මුදල් රෙගුලාසි 452 (1) හි සඳහන් විගණන විමසුම් ලේඛනය නියමිත කාලයකට පසුව පරීක්ෂා කර බලා ලැබී ඇති විගණන විමසුම් වලින් පෙන්වා ඇති අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කල යුතු අතර එම විමසුම් වලට වහාම පිළිතුරු ලබා දිය යුතු වුවත් අමාත්‍යාංශය වෙත නිකුත් කරන ලද විගණන විමසුම් 13 ක් සඳහා මෙම වාර්තාවේ දින වන විටත් පිළිතුරු ලබා දී නොතිබුණි.	මෙම විගණන විමසුම් සඳහා පිළිතුරු ඉදිරියේදී ඉදිරිපත් කරමි.	විගණන විමසුම් සඳහා පිළිතුරු ලබා දීමට කටයුතු කළ යුතුය.

4.10 කළමනාකරණ දුර්වලතා

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2016 අප්‍රේල් 08 දින සිට 2021 අප්‍රේල් 07 දින දක්වා එනම් වර්ෂ 05 ක කාල සීමාවක් සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශය සඳහා කුලී පදනම මත පෞද්ගලික සමාගමක් සමඟ ඇතිකර ගත් අංක 2178 දරන බදු ගිවිසුම ප්‍රකාරව ශ්‍රී ජයවර්ධන කෝට්ටේ, අංක 288 හි පිහිටි DPJ TOWER නැමැති ගොඩනැගිලි පරිශ්‍රය බදු දීමනාකරුට නැවත 2020 ජනවාරි 31 දින භාරදී ඇතත් අමාත්‍යාංශය විසින් එම බදු දීමනාකරු වෙත ගෙවන ලද රු.මිලියන 63 ක ආපසු ගෙවිය යුතු ආරක්ෂිත තැන්පතුව මේ දක්වා අයකර ගෙන නොතිබුණි.ගිවිසුම් කොන්දේසි අංක 11 අනුව ගිවිසුම අවසන් වී බදු දේපළ භාරදීමෙන් එක් මසක කාලයක් තුළ බදු දීමනාකරු එම ගෙවිය යුතු ආරක්ෂිත තැන්පතුව බදු ගැණුම්කරු වෙත ලබාදීමට කටයුතු කළයුතු වේ. ඒ අනුව බදු දීමනාකාර පාර්ශ්වය විසින් නීතිවිරෝධී ලෙස මෙම ආරක්ෂක තැන්පතුව රඳවා තබාගෙන මේ වන විට ඉක්මවා ගොස් ඇති කාලය වර්ෂ 04ක් විය.	බදු ගිවිසුම අනුව වසර 05ක් සඳහා ගොඩනැගිල්ල බදු ගැනීමට ගිවිසුම් ගත වී අදාළ ගිවිසුම ප්‍රකාරව දේපලේ නිරවුල් භුක්තිය නැවත භාර දීමෙන් අනතුරුව තැන්පත් මුදල වූ රු.මිලියන 63 ක තැන්පතුව එකඟ වූ පරිදි එම ආයතනය ගෙවා නොමැත. තැන්පත් මුදල අයකර ගැනීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුව DPJ ආයතනය වෙත එන්තර වාසි යවා ඇත. ඊට පිළිතුරු වශයෙන් 2022.11.21 දින දරන ලිපිය මඟින් ඔවුන් ලක්ෂ 300 ක මුදලක් ගෙවීමට එකඟ වී ඇත. එම එකඟ වූ ලක්ෂ 300 ක මුදල අයකර ගැනීමටත් ඉතිරි මුදල සඳහා නඩු පැවරීමටත් ඇති හැකියාව පිළිබඳ දැනුවත්වීම පිණිස 2023.05.09 දින ලිපියක් නීතිපති දෙපාර්තමේන්තුව වෙත යවන ලදී. කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් ඉහත ගෙවීමට එකඟ වූ රු ලක්ෂ 300 ක මුදල ගෙවන ලෙස ඉල්ලමින් DPJ ආයතනය	තැන්පතු මුදල අයකර ගත යුතුය.

	වෙත 2024.12.17 වන දින යවන ලද ලිපියට ප්‍රතිචාර වශයෙන් රු. ලක්ෂ 300ක මුදල එම කාල සීමාව තුලදී ගෙවීමට ඇති නොහැකියාව පිළිබඳව සඳහන් කරමින් ඒ සම්බන්ධයෙන් සාකච්ඡාවක් ඉල්ලමින් DPJ ආයතනයේ සභාපති ඩී. යූ ජයසිංහ මහතාගේ අත්සනින් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කල 2024.12.30 දිනැති ලිපිය අනුව නීතිපති දෙපාර්තමේන්තුවේද දැනුවත්වීම සහිතව 2025.03.03 දින ආරම්භක තැන්පතු මුදල නැවත අයකර ගැනීම සම්බන්ධයෙන් විශේෂ සාකච්ඡාවක් පවත්වන ලදී. එහිදී මිලියන 63 වූ සමස්ථ වටිනාකමින් රු. ලක්ෂ 300 මුදල පවා වසරක් තුලදී ගෙවීමට අසීරු බව DPJ ආයතන පාර්ශවය සඳහන් කල අතර ඒ සම්බන්ධයෙන් ගෙවීම් සැලැස්මක් ඉදිරිපත් කිරීම සඳහා 2025.03.07 දක්වා කාලය ලබා දෙන ලෙස ඉල්ලීම් කළද, ගෙවීම් සැලසුම් කාල රාමුව සති දෙකකට ආසන්න කාලයක් ගතවීමෙන් අනතුරුවද ඉදිරිපත් නොවීම හා ඒ සම්බන්ධයෙන් DPJ ආයතනයේ කිසිඳු ප්‍රතිචාරයක් නොවීම මත තැන්පතු මුදල නැවත අයකර ගැනීම සම්බන්ධව අධිකරණමය ක්‍රියාමාර්ග ගන්නා ලෙස ඉල්ලමින් ගරු නීතිපතිතුමා වෙත 2025.04.02 දින ලිපියක් ඉදිරිපත් කර ඇත.	

5. මානව සම්පත් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	අමාත්‍යාංශයෙහි ප්‍රධාන තනතුරු වන ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්, අධ්‍යක්ෂ, නියෝජ්‍ය අධ්‍යක්ෂ, අභ්‍යන්තර විගණක, සහකාර ලේකම්, ගණකාධිකාරී වැනි තනතුරුද ඇතුළත්ව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ වැවිලි කර්මාන්ත අංශයේ අනුමත සේවක සංඛ්‍යාව 833 ක් වූ අතර එයින් 62 ක් පුරප්පාඩුව පැවති අතර කෘෂිකර්ම අංශයේ තනතුරු 143 ක්, පශු සම්පත් අංශයේ තනතුරු 26 ක් පුරප්පාඩුව පැවතිණි. පවත්නා පුරප්පාඩු නැවත සමාලෝචනය කර ඒ අනුව සුදුසු පරිදි තනතුරු පිරවීමට හෝ අනුමත කාර්ය මණ්ඩලය සංශෝධනයට පියවර ගෙන නොතිබුණි.	2024.12.31 දිනට කෘෂිකර්ම අංශයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 22 ක් පැවතුනි.තවදුරටත් පුරප්පාඩු පවතින තනතුරු සම්පූර්ණ කිරීම සම්බන්ධව පරිපාලන බලධාරීන් දැනුවත් කර ඇත.වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය සඳහා අවශ්‍ය ප්‍රශස්ත කාර්ය මණ්ඩලය යෝජනා කර ඇත.කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක DMS/CM/24/23 හා 2025.01.15 දිනැති ලිපියෙන් වැවිලි අංශයට හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශයට වෙන් වෙන් වශයෙන් කාර්ය මණ්ඩලය අනුමත කර ඇත.අනුමත තනතුරුවල පවතින	වර්තමාන අවශ්‍යතාවයට සරිලන පරිදි සේවක සංඛ්‍යාව සංශෝධනය කිරීමට හා අත්‍යවශ්‍ය තනතුරු සඳහා බඳවා ගැනීමට පියවර ගත යුතුය.

පුරප්පාඩු සඳහා අවශ්‍ය කටයුතු කරන ලෙසත් දන්වා රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය වෙත ලිපි යොමු කර ඇත.පශු සම්පත් අංශයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩුව පවතින අතිරේක ලේකම් (සංවර්ධන) හා ප්‍රධාන ගණකාධිකාරී තනතුරුවල පූර්ණ කාලීනව වැඩ බැලීමට නිලධාරීන් පත්කර ඇති අතර, ද්විතික මට්ටම හා ප්‍රාථමික මට්ටමේ පවතින පුරප්පාඩු පිරවීම සඳහා ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත දන්වා ඇත.